භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2026 සැප්තැම්බර් - ඔක්තෝබර් | 127 වන කාණ්ඩය - 05 කලාපය | පිටු 32 | DOP/MAGAZINE/03/2026



## පවුලේ මහිමාලංකාරය

ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# පොඩි දූවගේ සිනා වැලයි

ගී පද - මහාචාර්ය සුනිල් ආරියරත්න
සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - සෝමතිලක ජයමහ



**පොඩි දූවගේ සිනා වැලයි**
**පොඩි පුතුගේ කතා පෙළයි**
**ප්‍රිය බිරිඳගේ සෙනේ විලයි**
**මගේ නිවන මගේ පැල්පතයි**

**කටු මැටි ගෑ බිත්ති පුරා**
**පලිඟු මැණික් එළිය දිලේ**
**ගොම මැටි ගෑ ගෙබිම මගේ**
**පියවිලි බුමුතුරුණු වගේ**

**ලබන නමුත් දුක් පීඩා**
**කුඩු උනොත් පුංචි පැලේ**
**අඹු දරුවන් අතරතුරේ**
**මට නිම් නැති සුවය දැනේ**

ගම්බද කුටුම්භයක් තුළ පවතින ආදරයේ සුන්දර අන්දරය, සෝමතිලක ජයමහ ගායන ශිල්පියා සිය ගැමි සුවඳ වැහෙන මියුරු කටහඬින් මෙලෙස ගෙනහැර දක්වයි. සුනිල් ආරියරත්න මහතාගේ උපමා රූපක බහුල මෙම අසිරිමත් පදපෙළ විසින් එහි රසය තවත් උද්දීපනය කරන බැව් අවිවාදාත්මක ය.

කුඩා දූවකියගේ නිමක් නැති සිනාවන් රචකයා දකින්නේ "සිනා වැලක්" ලෙසිනි. පුංචි පුතුණුවන්ගේ සල්ලාපයද "කතා පෙළකි". ප්‍රිය බිරිඳගේ අනුපමේය සෙනෙහස වනාහී සිත් සනහන "සෙනෙහෙ විලකි". ඒ නිසා රචකයාට නම් සිය දිළිඳු පැල්පත, ඔහුට සෙවන දෙන 'නිවහනක්' පමණක් නොව, සිත නිවන "නිවන" යි.

සිය කුඩා පැල, රජ මැඳුරකටත් වඩා සුවය සදන බව ඒත්තු ගන්වන්නට රචකයා යොදා ගන්නේ අපූරු රූපක යුගලයකි. අතීත සිරිලක, ආලෝකය ඇතුළට ලබා ගැනීම සඳහා කපා ඔපදමා ගත් පළිඟු (Quartz) වලින් සැදූ ජනේල හෝ කවුළු, රජ මාළිගාවල සහ ප්‍රභූ වලව්වල භාවිත කළ බවට ඓතිහාසික සාක්ෂි තිබේ. එලෙසම, අගනා බුමුතුරුණු සහ සිනිඳු පාවාඩ මිලදී ගැන්මට හැකියාව තිබුණේ ද ධනවතුන්ට පමණි. එහෙත් අප රචකයාට නම්, සිය කුඩා නිවසේ කටු මැටි ගෑ බිත්ති පුරා දිලෙන්නේ පලිඟු මැණික් එළියයි. ගොම මැටි ගෑ ගෙබිම පුරා තිබෙන්නේ පියවිලි බුමුතුරුණුයි.

කුඩු තනන්නේ කුරුල්ලන් ය. රචකයාට සිය පුංචි පැල සොඳුරු කුරුලු කැදැල්ලක් වැනි ය. තාවකාලික සතුටවල් සොයා රැ. බෝ වනතුරු නිවෙසින් බැහැරව සිටින දෙමාපියන් බහුල මෙවන් කලෙක, මේ පියාට නම් සිය පවුලෙන් ලැබෙන්නේ සදාකාලික පරම සුවයකි. අඹුදරුවන් රැකගන්නට අපමණ දුක් දරන්නට සිදුවුවත්, දවස අවසන ඔහුගේ දාහය නිවන්නේ, සැදෑ සමයෙහි සිය පුංචි කැදැල්ලෙහි කුඩු වීමෙන් පමණි.

පවුලක අසිරිය විදහාපාන ගීත ඇත්තේ අතලොස්සකි. ඒ අතරින් මේ ගීතයට ලැබෙන්නේ සුවිශේෂී ස්ථානයකි. එය බොහෝ හදවත් වල සදා නොමියෙන සලකුණක් සනිටුහන් කර තිබෙන බැව් නම් නොඅනුමාන ය.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# ශක්ති ප්‍රබෝධනය


**2026 සැප්තැම්බර් - ඔක්තෝබර්**

ප්‍රකාශනය

**නිර්මල මරිය නිකාය**

භාරකරු

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහය

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
මිල්ශානි ප්‍රනාන්දුපුල්ලේ

කවර නිර්මාණය

අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම

නිලුමිණ හර්ෂාන්

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 සමාජයේ මහිමාලංකාරය පවුලයි
කපිල ආසිරි සිල්වා

7 දරුවන් නැති ... - ශාන්තලාල් හෙට්ටිආරච්චි

8 පවුලේ මහිමාලංකාරය ... - ඉමාන් අබේරත්න

9 යුද්ධයට ගිය පුතා - ඩී. එම්. ජයන්ති පෙරේරා

10 අභ්‍යන්තර සුවය ... - මලින්ත බෝපෙආරච්චි

11 දෙව් සමිඳුනි ආසිරි ... - ස්වර්ණලතා පීරිස්

12 දෙවියන් වහන්සේගේ ප්‍රේමය මිහිමත ජීවමාන ...
ලැරින් ප්‍රියානි ප්‍රනාන්දු

13 ආයු කාලයට බලපාන, ඔබේ ඇසුර
අයිවෝ හපුආරච්චි

14 කෙටි කතාව - කැතරින් ගුණවර්ධන

16 ශුද්ධවූ පවුල වත්මන් ... - ශෙලින්ඩා සමරසිංහ

12 ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී මුහුණේ ...
ගරු පැට්‍රික් විජේසිංහ පියතුමා

20 තුන් කල් දුටු යතිවරයාණෝ - අනිල් ප්‍රසන්න

22 **The Beauty of Family Life**
Fr. Chamika Sudarshana OMI

24 මේ අහන්න... - රූපස් ප්‍රැන්සිස්
මෙන්න තවත් ත්‍යාගයක්...

25 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 93
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 ප්‍රහේලිකා අංක 91 පිළිතුරු හා ජයග්‍රහණ

29 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

31 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළ වන
ඉපැරණි ම සිංහල සඟරාව යි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළ වන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

පාරිශුද්ධභාවය යනු මනුෂ්‍යත්වයේ මූලාරම්භය ලද අමිල උත්තම ත්‍යාගයයි. එසේ ශුද්ධ බයිබලය තුළද සියල්ලක ආරම්භය අපට පසක් කරන්නේ පාරිශුද්ධභාවය යි. එසේම ශුද්ධවූ කතෝලික සභාව තුළ විවාහ සක්‍රමේන්තුවද පවුලක ආරම්භයේ පාරිශුද්ධභාවය පෙන්නුම් කරයි. අද විවිධ සමාජීය පසුබිම් මත පදනම්ව මිනිස් මනසේ හටගන්නා අනිසි චින්තන විලාසයන් හේතුවෙන් පාරිශුද්ධව ඇරඹි බහුතර පවුල්වල සාමය, සමගිය සහ ප්‍රේමය හා බැඳි ඒ පාරිශුද්ධභාවය කෙලෙසී ඇත්තේ මන්ද? නිසි පදනමක් නැති, සත්‍යයක් නැති, දූෂිත මං මාවත්වල අතරමංව විකෘත මානසික ව්‍යාධීන්වලට හසුවීම එයට හේතුව වී ඇත. සත්‍යතාවයේ පදනමක් මත ගොඩනැගී තම පවුල පාරිශුද්ධභාවයට නැවත රැගෙන යන්නට මෙවර භක්ති ප්‍රබෝධනය එළියක් වන්නේ ශුද්ධවූ පවුලේ පරමාදර්ශී පැවත්මේ විශ්ලේෂණය ඔබට ත්‍යාග කරමිනි.

**අචල රූපසිංහ**

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා,
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor,
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# පවුලේ මහිමාලංකාරය

හෙළිදරව්ව



පවුල යනු මිනිස් සමාජයේ මූලිකම ඒකකය යි. ශුද්ධ වූ බයිබලයේ උත්පත්ති පොත පවසන්නේ දෙවියන් වහන්සේ මිනිසා තම ස්වරූපයට මවා, පුරුෂයා සහ ස්ත්‍රිය එක්කර විවාහයට කැඳවූ ආකාරය යි (උත්පත්ති 1:27). "මිනිසා තම පියා සහ මව අත්හැර තම භාර්යාවට බැඳෙන්නේ එබැවින් ය. මෙලෙස ඔවුන් එක් කෙනෙක් වන්නෝ ය" (උත්පත්ති 2:24).

මේ අනුව පවුල මනුෂ්‍යයා නිර්මාණය කළ ආයතනයක් නොව, දෙවියන් වහන්සේගේ ම සැලැස්මකට අනුව පිහිටුවනු ලද ජීවිත හවුලකි. එමෙන්ම පවුල මනුෂ්‍යයාගේ ස්වාභාවික අවශ්‍යතාවයකි. දරුවෙකුට ආදරය, රැකවරණය සහ මඟපෙන්වීම අත්‍යවශ්‍ය ය. එය සපයන හොඳම පරිසරය පවුල යි.

**පවුල් ව්‍යුහය විවිධාකාරය**

1. න්‍යෂ්ටික පවුල - මව, පියා සහ දරුවන්ගෙන් සමන්විත පවුල
2. විස්තීරණ පවුල - සීයා, ආච්චි, මාමාලා, නැන්දලා සහ අනිකුත් ඥාතීන් සමඟ එකට ජීවත් වන පවුල
3. තනි මා පිය පවුල - එක් මා පියෙකු සහ දරුවන්ගෙන් සමන්විත පවුල
4. දරුවන් හදාගත් පවුල - දරුවන් හදාගෙන ආදරයෙන් රැක බලා ගන්නා පවුල

ව්‍යුහය වෙනස් වුවත් සෑම පවුලකම මූලික පරමාර්ථය වන්නේ සාමාජිකයන්ගේ යහපත සහ සංවර්ධනය යි.

**ශුද්ධ පවුල සියලු පවුල්වල පරමාදර්ශය යි**

ජේසුස් වහන්සේ, මරිය තුමිය සහ ජුසේ තුමාගෙන් සමන්විත ශුද්ධ වූ පවුල සියලු කිතුනු පවුල්වලට ආදර්ශයකි. ශුද්ධ වූ පවුලේ තිබුණා වූ සරලකම, පාරිශුද්ධත්වය, කීකරුකම, යාච්ඤාව, වෙහෙස මහන්සිය සහ දෙවියන් වහන්සේ කෙරෙහි තිබුණා වූ පූර්ණ ඇදහිල්ල අපගේ පවුල්වලට පහන් ටැඹක් විය යුතු ය. ජේසුස් වහන්සේ තම දෙමාපියන්ට කීකරු වූ අතර මරිය තුමිය "ඔබගේ වචනය ලෙස මට සිදු වේවා" යි යනුවෙන් සියල්ල බාර දීමෙන් දෙවියන් වහන්සේගේ සැලැස්මට අවනත වූවා ය. ශුද්ධ වූ ජුසේ තුමා නිහතමානී, වගකීම් සහිත පවුල ආරක්ෂා කළ සුරැකි පියා ලෙස කැපී පෙනෙයි.

**විවාහ සක්‍රමේන්තුව**

කතෝලික සභාවේ විවාහය ප්‍රසාද නිධානයක් හෙවත් සක්‍රමේන්තුවකි. එය පුරුෂයා සහ ස්ත්‍රිය අතර ජීවිත කාලය පුරා පවතින කොන්දේසි රහිත ප්‍රේමයේ සහ විශ්වාසවන්තකමේ ගිවිසුමකි. මේ බැඳීම ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර ඇති ආදර සම්බන්ධතාවය නිරූපණය කරයි (එපීස 5:25-33).

**විවාහය අඛණ්ඩව පවත්වා ගෙන යාමට නම්**

- ආදරය කොන්දේසි රහිත විය යුතු ය.
- එකිනෙකාට ගෞරව කළ යුතු ය.
- සමාව දීමට සහ සමාව ලැබීමට, තේරුම් ගැනීමට සහ තේරුම් කර දීමට හැකි විය යුතු ය.
- උපරිම විශ්වාසය පවත්වා ගත යුතු ය.
- එකිනෙකාට සහය විය යුතු ය.
- දරුවන් දේව දීමනාවක් ලෙස පිළිගත යුතු ය.

**ගෘහස්ථ සභාව**

දෙවන වතිකානු මන්ත්‍රණ මහා සමුළුව, පවුල "ගෘහස්ථ සභාව" ලෙස හඳුන්වයි. එහි අදහස වන්නේ නිවස යනු දිනපතා යාච්ඤා කරන, ශුද්ධ ලියවිල්ල කියවන, දේව වචනය සහ කතෝලික සභාවේ ඉගැන්වීම මත පදනම් කර ගනිමින් ජීවිත හැඩගස්වන සහ දරුවන්ට ඇදහිල්ල ලබා දෙන ස්ථානයක් බවට පවුල පත් කරගැනීමයි. ඉරුදින සහ අනිවාර්යයෙන් සහභාගි විය යුතු දිනයන්හි දිව්‍ය පූජාවට සහභාගි වීම, දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම, ආදරය සහ දයාව ඉගැන්වීම, අසරණයන්ට පිහිට වීමට උගන්වන ස්ථානයක් වීම පවුලක කිතුනු ගුණාංග වේ.

**පියා**

කිතුනු පවුලේ නායකයා පියා ය. එහෙත් එම නායකත්වය ක්‍රිස්තුන් වහන්සේ සේවක නායකත්වයේ කොටස්කරුවකු වීම මිස ඒකාධිපති නායකත්වයක් නොවිය යුතු ය. පවුලක ආත්මික නායකත්වය, දරුවන්ට ආදර්ශයක් වීම, බිරිඳට ගෞරවයෙන් සහ ආදරයෙන් සැලකීම, තම යුතුකම් සහ වගකීම, කැපවීමෙන් සහ වැයවීමෙන් ඉෂ්ඨ සිද්ධ කිරීම, පවුලේ ආරක්ෂාව සහ සුබ සාධනය තහවුරු කර ගැනීම පියෙකුගේ සුවිශේෂ ලක්ෂණ වේ.

**මව**

මව පවුලේ හදවත යි. ඇය දරුවන්ගේ මුල් ගුරුතුමිය යි. ආදරයෙන්, සංයමයෙන්, දයාවෙන් විශ්වාසයෙන්, කැපවීමෙන් සහ වැයවීමෙන් පවුලේ බර මහ පොළව සේ උසුලයි. පවුල එකට එකතු කරයි. මරිය තුමියගේ මාතෘකත්වයේ උතුම් ආදර්ශය ඇයගේ නිහතමානිකම, සරලකම, පිරිසිදුකම සහ අචල විශ්වාසය තුළින් පිළිබිඹු කරයි.

**දරුවන්**

දෙවියන් වහන්සේගෙන් ලැබෙන දීමනාවකි දරුවන්. තම දෙමාපියන්ට ගෞරව කිරීම, ආදරය දැක්වීම, කීකරුකමින් සහ සංවේදී ඉරියව් තුළින් තම දෙමව්පියන්ට ශක්තියක් විය යුතු ය. අවංකව, අව්‍යාජව තම සහෝදර සහෝදරියන් සමඟ සහයෝගයෙන්, සරලකම, තුළ ජීවත් විය යුතු ය. ගුරුවරුන්ට, වැඩිහිටියන්ට, පිදිය යුත්තන්ට පිදීම ඇතුළු කෘතවේදී වෙමින් තම හැකියාවන්, කුසලතාවන්, නිර්ලෝභීව අන් අය සමඟ බෙදා ගැනීමට දේව තාත්තා දූදරුවන්ව කැඳවනු ලබයි.

**ආදරය**

ශුද්ධ වූ පාවුලු තුමා 1 කොරින්ති 13 වන පරිච්ඡේදයේ ආදරය පිළිබඳව විශිෂ්ට අදහසක් මතු කරයි. ආදරය, ඉවසිලිවන්තය, කරුණාවන්ත ය, ඊර්ෂ්‍යා නොකරයි, අහංකාර නොවේ, නපුර සිතෙහි තබා නොගනියි. මෙවන් අදහසක් පවුල තුළ ජීවමාන වූ විට මොන තරම් අදහස් විවිධ වුවද, විරෝධතා පවා සංවාදයෙන් සාමයෙන් විසඳාගත හැකි ය. සැබෑ පවුලක ශක්තිය ඇත්තේ ධනය සම්පත් මත නොව ආදරය, සමාව, විශ්වාසය, තේරුම් ගැනීම සහ සහකම්පනය මත ය. එසේ නොවුණත් කෝපය, වෛරය, පළි ගැනීම මතු වී ගහමරා ගැනීමට ද පවුලේ සාමාජික සාමාජිකාවන් තල්ලු විය හැකි ය.

**පවුලට ඇති අභියෝග**

ආර්ථික දුෂ්කරතා, මානසික ආතතිය සහ ජීවන පීඩනය, විදේශීය රැකියා නිසා පවුල් වෙන් වීම, තාක්ෂණය සහ සමාජ මාධ්‍යවලට අධික ලෙස නැඹුරුවීම, මත්ද්‍රව්‍ය සහ මත්පැන් භාවිතය, දරුවන් සමඟ ගත කරන කාලය අඩු වීම, අනියම් ලිංගික සම්බන්ධතාවන්, සූදුව වැනි මුදල් නාස්ති වන දෑ සඳහා ඇබ්බැහි වීම, අසංවේදී ඉරියව්, තොරතෝංචියක් නැතිව කරන, නොගැළපෙන කථා, එකට ආහාර ගැනීමට සහ සංවාදයට කාලයක් නැති වී යාම, ආගමික ජීවිතය දුර්වල කර ගැනීම, කාලය කළමනාකරණය කර ගන්නට අපොහොසත් වීම, පුද්ගල කේන්ද්‍රීය ජීවිත මතු වීම, විවාහ බිඳ වැටීම සහ දික්කසාද වලට යොමු වීම පවුලට ඇති අභියෝග වේ.

ශුද්ධ පවුල අපගේ ආදර්ශය කර ගනිමින්, ජීවත් වන විට පවුලේ මහිමාලංකාරය තව තවත් බැබළෙයි. එවැනි පවුල් සභාව ශක්තිමත් කරයි. සමාජය යහපත් කරයි. රටකට ආශිර්වාදයක් ගෙන එයි. එබැවින් ම සෑම කිතුනු පවුලක් ම දෙවියන් වහන්සේගේ ප්‍රේමය ලොවට ප්‍රකාශ කරන්නට ජීවමාන සාක්ෂියක් වීමට කැඳවනු ලැබ ඇත.

**සංස්කාරක පියතුමා**

# සමාජයේ මහිමාලංකාරය පවුලයි.



සමාජයක් තුළ සිටින පුද්ගලයා කෙසේ ක්‍රියා කළ යුතුද, ඔවුන්ගේ හැසිරීම් කෙසේ ගොඩනඟා ගත යුතුද යන්න පෙන්වා දෙමින් ඔවුන් ගමන් කළ යුතු දිශානතිය පෙන්වා දෙන්නේ එම සමාජය තුළ පවතින සමාජ සංස්ථාවන් ය. මෙය සමාජ විද්‍යා දැක්මට අනුව ආකාර පහකින් විග්‍රහ කෙරේ.

- පවුල් සංස්ථාව
- ආර්ථික සංස්ථාව
- ආගමික සංස්ථාව
- අධ්‍යාපනික සංස්ථාව
- දේශපාලනික සංස්ථාව

මෙම සමාජ සංස්ථාවල පදනම වන්නේ පවුල් සංස්ථාවයි. පවුල සමාජයේ පවතින කුඩාම ඒකකයයි. පවුල යනු "සාපේක්ෂව ස්ථිර යැයි කිව හැකි දෙදෙනෙකුට වැඩි ගණනක් අන්තර්ගත වූ ඒ අය ලේ නෑකමින්, විවාහයෙන් හෝ නීතියෙන් දරුකමට ගැනීමෙන් එකිනෙකාට සම්බන්ධ වූ , එකට ජීවත් වන , ආර්ථික වශයෙන් එක් වූ සමූහයකි" යන්න සමාජ විද්‍යාඥයින්ගේ මතයයි.

මෙම කුඩාම ඒකකය සාර්ථකත්වයට, දියුණුවට පත්වෙනවා යැයි පවසන්නේ ඉබේටම සමස්ත සමාජයම සාර්ථකත්වයටත්, ඉදිරියටත් යන බවයි. එසේ සාර්ථක මාවතකට පිවිසීමේදී පවුල් සංස්ථාවට කාර්යභාරයන් කිහිපයක් ඉටු කිරීමට ඇත.

- ලිංගික අවශ්‍යතා සපුරා ගැනීම
- දරුවන් බිහි කිරීම
- දරුවන් හැදීම
- ආර්ථික සහජීවනය
- සෙනෙහස ලබාදීම

මෙම අංශ පහ එකිනෙකට විතැන්වන කරුණු නොවේ. මේවා සියල්ල එක දම්වැලක පුරුක් මෙන් සම්බන්ධ වී පවතී. ඒ මන්ද යත් පවුල, නිවසක් පමණක් නොව, හදවත් එකට බැඳ තබන ආදරයේ, කැපවීමේ සහ වගකීමේ පූජාසනයක් වන බැවින්ය.

ස්ත්‍රී-පුරුෂ සම්බන්ධය ලොව පහළ වූ පසු එය අඹු සැමි සම්බන්ධයක් කරා වර්ධනය වී ඉන්පසු එය මා පිය-දූ දරු සම්බන්ධයක් දක්වා ගොඩනැගුණි. මෙම මා පිය-දූ දරු සම්බන්ධය අන් සෑම බන්ධනයකටම වඩා ප්‍රබලව පවුල් ඒකකය තුළ ක්‍රියාත්මක වෙයි.

"රාහුලෝ ජාතෝ-බන්ධනං ජාතං" යැයි සිදුහත් කුමාරයා රාහුල පුතුගේ උපත ඇසූ කෙණෙහිම ප්‍රකාශ කළේ මව් පිය-දූ දරු බන්ධනයේ ප්‍රබලත්වය නිසාමය. පවුල් ඒකකයක චිර කාලීන යහපත් පැවැත්ම තහවුරු කෙරෙන ප්‍රබලම සාධකය ලෙසද මෙම සම්බන්ධය හඳුන්වා දියහැකිය.

පවුලක දෙමව්පියන්ගෙන් දරුවන් වෙතද දරුවන්ගෙන් දෙමව්පියන් වෙතද ඉටුවිය යුතු යුතුකම් පිළිබඳව බෞද්ධ ඉගැන්වීමේ " සිඟාලෝවාද සූත්‍රය" තුළින් කදිම ලෙස නිරූපණය කර පෙන්වයි.

**දෙමව්පියන්ගෙන් දරුවන්ට ඉටු විය යුතු යුතුකම් :**

- පාපයෙන් වළක්වා යහමගට යොමු කිරීම
- යහපත් ශිල්පයක් ලබාදී ගුණදම්, වටිනාකම් වර්ධනය කිරීම.
- සුදුසු කල ආවාහ විවාහ කටයුතු සම්පාදනය

- සුදුසු කාලයේ දී දේපල, උරුම පවරාදීම
- අනාගත ආර්ථික සුරක්ෂිතතාවයට මග පාදා දීම

**දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතු යුතුකම් :**

- දෙමව්පියන් පෝෂණය කිරීම සහ රැක බලා ගැනීම
- ඔවුන්ට ගෞරවයෙන් හා කීකරුකමින් කටයුතු කිරීම
- පරම්පරාගත ගෞරවය සුරැකීම
- දෙමව්පිය උරුමයන් සුරැකීම
- මියගිය පසු ඔවුන් සිහිපත් කරමින් පින් අනුමෝදනා කිරීම

මෙයාකාරයෙන් බලන කල බුදු දහම තුළින් පවුල් සංස්ථාවේ වැදගත්කම ඉමහත් වටිනාකමකින් අගය කර දක්වා ඇති බව පසක් වෙයි. තවදුරටත් පවසනවා නම් දූ දරු මාපිය සබඳතාවය "මංගල කරුණක්" ලෙසින් දක්වා ඇත.

"මාතා පිතු උපට්ඨානං - පුත්ත දාරස්ස සංඝහෝ" යනුවෙන් පවුලක කාර්ය භාරය මැනවින් විග්‍රහ කර තිබේ. මෙතුළින් කදිමට විද්‍යමාන වන්නේ සමාජයක කුඩාම ඒකකය වූ පවුල ඉතා සාර්ථකව මහිමාලංකාරයට පත්වන විට එය සමස්ත සමාජයේම මහිමාලංකාරයට බලපාන බවයි.

කිතුනු දහමේ ශුද්ධ වූ බයිබලය තුළත් මෙවැනි කරුණු විග්‍රහයන් කොතෙකුත් දක්නට ඇත. "පවුල" දෙවියන්ගේ සැලැස්මක් ලෙසයි කිතුනු දහමේ විශ්වාසය. උත්පත්ති පොතේ 2 : 24 හි සඳහන් පරිදි සැමියා සහ භාර්යාව එක් මාංශයක් බවට පත්වන බව කියැවෙයි. තවද පවුලක් ගොඩනැගෙන විවාහය ශුද්ධ වූ ගිවිසුමක් වශයෙන් සඳහන්ය.

"දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා" (මතෙව් 19:6), යනුවෙන් ශුද්ධ වූ බයිබලය තුළ සඳහන් වන්නේ ඒ නිසාය. තවදුරටත් සිතා බලද්දී කිතුනු සභාව තුළ ශුද්ධ වූ පවුල ආදර්ශ සපයයි. ජේසුස් වහන්සේ, මරියතුමිය, ශුද්ධ වූ ජුසේ තුමාගෙන් සමන්විත ශුද්ධ වූ පවුල කතෝලික පවුල් සඳහා විශ්වාසය, කීකරුකම, ආදරය සහ කැපවීමේ ආදර්ශය සපයයි. මෙම ශුද්ධ වූ පවුල ලෙස සමස්ත පවුල් ගොඩනගා ගැනීමට උත්සාහ දරන්නේ නම් සමාජයම යහපත් ලෙස ගොඩනැගීම අසීරු කරුණක් නොවනු ඇත.

බිඳුණු හෝ කැඩුණු පවුල් තුළ ජීවත්වන දරුවන් බහුතරයක් සමාජ ව්‍යසනයන්ට පහසුවෙන්ම ගොදුරු වන්නන් බවට පත්වී තිබේ. ඔවුන්ගේ ජීවිත තුළ හරි හැටි අධ්‍යාපනයක් නොමැතිව, හරි හැටි සෞඛ්‍ය තත්ත්වයක් නොමැතිව, නොයෙකුත් සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වී තම ජීවිත විනාශයට පමුණුවා ගත් ආකාරයක් වර්තමානයේ නිරතුරුව අපට අසන්නට දකින්නට ලැබේ.

පවුලක තීරණාත්මක සාධකය වන්නේ "අම්මා"ය. අම්මා සහ දරුවන් අතර පවතින අත්‍යන්ත බැඳීම එම පවුලේ ජීවනාලියයි. බොහෝ විට විවිධ ආර්ථික දුෂ්කරතා නිසා ශ්‍රමිකයන් බවට පත්වී විදේශගත වූ මව්වරුන් සිටින පවුල් කඩා බිඳී විසිරයාමේ ප්‍රවණතාවයක් දැක ගත හැකියි. තම සැමියා සමග යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමට අපොහොසත් වීම , සැමියාගේ සෙනෙහස නොලැබීම වැනි කරුණු කාරණා මත අනියම් සබඳතාවයක් තුළින් සැනසීමක් සොයා යන අම්මා වරුන් සිටින පවුල් බොහොමයක්ද එවැනි කඩා බිඳී විසිරීම් වලට ලක් වූ අවස්ථා එමටය. එම නිසා "අම්මා" යන අක්ෂරත්‍රය පිළිබඳ කදිමාදර්ශය සපයන්නේ "මරිය අම්මා" ය එතුමිය සියලු දුක් සුසුම් ඉවසා දරා ගත් කාන්තාව යි.

මේ අනුව බලන කල ආදරය පවුලේ පදනමයි. සැමියා තම බිරිඳට ක්‍රිස්තුස් වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන් ප්‍රේම කළ යුතු අතර දෙදෙනාම එකිනෙකාට ගෞරවයෙන් ජීවත් විය යුතුය යන්න එපීස 5 : 21 - 33 දක්වා වූ කොටසේ පෙන්වා දී තිබේ. ස්වාමියා තම භාර්යාව කෙරෙහි අවංක වීමත් එම සබඳතාවය ශක්තිමත් කර ගැනීමට පදනම වෙයි. සැබවින්ම පවුල යනු ආදරයේ හා ආරක්ෂාවේ තොටිල්ලයි. ජීවිතයේ

දුෂ්කර අවස්ථාවලදී රැකවරණය ලැබෙන පළමු ස්ථානය වන්නේ ද පවුලයි.

පවුල සමාජයේ "හදවත" බඳු වන නිසා හදවත නිරෝගී වූ විට ශරීරය නිරෝගී වන්නා සේ, පවුල යහපත්වන විට සමාජයත් යහපත් වේ. පවුලේ සමගිය සමාජයේ සාමයට පදනම වේ. සමගියෙන් සාමකාමීව ජීවත් වන පවුල් සාමකාමී සමාජයක් බිහිවීමට මූලික පදනම සපයයි. එනම් පවුලක් මහිමයටත් අලංකාරයටත් පත්වන විට සමාජයක් මහිමයටත් අලංකාරයටත් පත් වනු ඇත.

පාදක සටහන් :

- ශුද්ධ වූ බයිබලය
- සමාජ විද්‍යාවේ මූලධර්ම - මහාචාර්ය නන්දසේන රත්නපාල
- ප්‍රබුද්ධ ලිපි මාලා - සංස්කරණය පූජ්‍ය ආනමඩුවේ ධම්මදස්සි හිමි
- මහෝපදේශය - අතිඋතුම් ඔස්වල් ගෝමිස් අගරදගුරු හිමිපාණන්

ශාස්ත්‍රපති කපිල ආසිරි සිල්වා
ගුරු සේවය, ශාන්ත පීතර විදුහල කොළඹ 04.

# දරුවන් නැති පවුලක් තුළත් මහිමයක්, ගෞරවයක් සහ සාර්ථක පවුල් ජීවිතයක් තිබිය හැකිද?

දරුවන් නොමැති පවුලක් යනු අසාර්ථක පවුලක් නොවේ. සමාජය තුළ බොහෝවිට පවුලක වටිනාකම දරුවන්ගේ පැවැත්ම මත පමණක් මනින්නට පුරුදු වී ඇත. එහෙත් ක්‍රිස්තියානි දෘෂ්ටිකෝණයෙන් බලන විට පවුලක සැබෑ මහිමය පවතින්නේ ආදරය, එකමුතුකම, විශ්වාසය, හා දෙවියන් වහන්සේ කෙරෙහි ඇති භක්තිය තුළය.

දරුවන් නැති වීම බොහෝ අඹු - සැමියන්ට වේදනාකාරී අත්දැකීමක් විය හැකිය. කෙසේ වුවත්, ඒ තත්ත්වය ඔවුන්ගේ පෞරුෂය, විවාහ ජීවිතය, හෝ පවුලේ ගෞරවය අඩු කරන දෙයක් නොවේ. දෙවියන් වහන්සේ එක් එක් පවුලට දෙන ආශිර්වාදය වෙනස් විය හැකිය. සමහර පවුල් දරුවන්ගේ ආශිර්වාදයෙන් සෙසු බොහෝ පවුල්වලට සේවයක් කරන අතර, තවත් සමහර පවුල් සෙනෙහස, දයාව, සහ පරිත්‍යාගශීලීත්වය තුළින් විශාල ආලෝකයක් වන්නේ ය.

කතෝලික විශ්වාසයේ පවුල කියන්නේ ජීවිතයේ පුණ්‍ය පාසලකි. එහිදී සැමියා සහ බිරිඳ අතර ඇති විශ්වාසය, අවබෝධය හා සමාව දීම පවුල් ජීවිතය ශක්තිමත් කරයි. දරුවන් නොමැති වුවද, එවැනි යුවළක් පවුලේ වටිනාකම ඉහළින් තබා, අන් අයට ආදර්ශයක් විය හැකිය. ඔවුන්ගේ පවුල සාමකාමී නම්, යාච්ඤාවෙන් පෝෂිත නම්, සහ අනුන්ට සේවය කිරීමට කැපවී සිටී නම්, ඒ පවුලට නිසැකයෙන්ම මහිමයක් ඇත.

තවද, දරුවන් නොමැති පවුල් බොහෝවිට සමාජයට විශාල දායකත්වයක් ලබා දෙයි. ඔවුන් දුප්පතුන්ට උපකාර කරයි, අනාථ දරුවන්ට සෙනෙහස දක්වයි, ආගමික කටයුතු වලට සහභාගී වන අතර අසල්වැසි ජීවිතයට ආලෝකයක් ද වෙයි. එවැනි පවුල්වල පවතින ආදරය දරුවන් නොමැතිකමෙන් සීමා නොවී, එය අනෙක් අය වෙතත් පැතිර යයි. ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම අනුව සැබෑ ප්‍රේමය තමන්ගෙන් ඔබ්බට ගොස් අන් අයව පිළිගැනීමයි.

එබැවින්, දරුවන් නැති පවුලක් තුළත්, මහිමයක්, ගෞරවයක් සහ සාර්ථක පවුල් ජීවිතයක් තිබිය හැකිය. පවුලක වටිනාකම දරුවන්ගෙන් පමණක් නොව, දෙවියන් වහන්සේට කැප වූ ජීවිතයකින්, එකිනෙකාට දක්වන ආදරයෙන්, සහ අන්‍යයන්ට සෙනෙහසින් සේවය කිරීමෙන් මැනිය යුතුය. එවැනි පවුලක් සමාජයට පමණක් නොව, දෙවියන් වහන්සේටත් ප්‍රසන්න වූ පවුලක් වේ.

ශාන්තලාල් හෙට්ටිආරච්චි
දුන්ගල්පිටිය

# පවුලේ මහිමාලංකාරය - "අප පවුලම දෙවි මහිමය උදෙසා"



**හැඳින්වීම**

සමාජයේ කුඩාම ඒකකය පවුල යි. අපි සියලු දෙනාම මේ ලෝකය තුළ පවුලකට අයත් ය. පවුලකට සම්බන්ධ නැති පුද්ගලයන් සමාජයේ ඇත්තේ ඉතාම අල්ප වශයෙනි. කිතුනු සභාවේ ද කුඩාම ඒකකය පවුල යි. පවුල කුඩා සභාවකි. එම පවුල නැමති කුඩා සභාව බිහිවන්නේ ආශිර්වාදකාර බන්ධනය නැමති දේව ප්‍රසාද නිධානය තුළිනි. එය දේව කැඳවීමකි.

**පවුලක් යනු,**

යම් තැනක පුරුෂයෙක්, ස්ත්‍රියක් හා ඒ දෙදෙනාගේ දරුවන් එකට වාසය කරන විට එතන පවුලක් ජීවත් වෙනවා යැයි කියන්නට අප පුරුදු වී සිටිමු. එකට ජීවත් වූ පමණින් පවුල යන නම භාවිත කිරීම ප්‍රමාණවත් නොවේ. පවුල යන වචනය ව්‍යවහාර කිරීමට නම් එම පිරිස කෙරෙහි වෙනත් ලක්ෂණ ද තිබිය යුතු ය.

**පවුලක ප්‍රධාන ලක්ෂණ කිහිපයක් :-**

- පවුලේ සාමාජිකයන් අතර ගැඹුරු මට්ටමෙන් පවත්වාගෙන යන සාර්ථක සම්බන්ධතාවය/බැඳීම.
- පවුල ගොඩනැගීමට හවුල් වූ දෙපළ අතර අඹු සැමියන් වශයෙන් ඉතා ගැඹුරු ආදර සම්බන්ධතාවයක් පැවතීම.
- දරුවන් සහ දෙමාපියන් අතර යහපත් දෙමාපිය-දරු සබඳතාවයක් පැවතීම.
- දරුවන් කීප දෙනෙක් සිටී නම් ඔවුන් අතර ද ගැඹුරු සහෝදර සම්බන්ධතා පැවතීම.

ඉහත සඳහන් ලක්ෂණ යහපත් ලෙස පවත්වාගෙන යන්නේ නම්, ඒ පිරිස වෙනුවෙන් පවුල යන වචනය යෙදීම අර්ථවත් වේ. මන්ද, පවුලක ප්‍රධාන ලක්ෂණය එය තුළ පවතින ගැඹුරු ආදර සම්බන්ධතා සමූහය යි.

**ගැඹුරු ආදර සම්බන්ධයක වැදගත්කම**

විවාහය සහ පවුල් ජීවිතය සාර්ථක කර ගැනීමට, සෑම විවාහක යුවළක්ම ප්‍රිය කරනවා නොඅනුමාන ය. එහෙත් පවුල් ජීවිතය සාර්ථක කර ගැනීමට වඩා වැදගත් වන්නේ කුමක්දැයි දන්නේ අතලොස්සකි. මිනිස් සිරුරේ පැවැත්මට වාතය අවශ්‍ය වන්නේ යම් සේ ද, විවාහයේ සහ පවුල් ජීවිතයේ යහ පැවැත්මට, ගැඹුරු ආදර සම්බන්ධතා අත්‍යවශ්‍ය වේ. එහෙයින් පවුල් ජීවිතයට ඇතුළු වී සිටින අයත්, ඇතුළු වීමට බලාපොරොත්තු වන අයත්, යහපත් සම්බන්ධතා ගොඩ නගා ගැනීමට අවශ්‍ය දක්ෂතා ඇති අය විය යුතු ය.

**කිතුනු පවුල හා ආශිර්වාදකාර බන්ධනය**

කිතුනු විවාහය දේව ප්‍රසාද නිධානයකි. ඒ තුළින් උත්ථාන වූ කිතු සමිඳුන් අපට හමුවන අතර, ඒ තුළින් අප ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසට සම්බන්ධ වේ. යුවළක් විවාහ වීමට යොමු කරන්නේ සියල්ලෙහි නිර්මාතෘවරයාණන් වන දෙවියන් වහන්සේ විසින් ය. උපදින්නටත් පෙර දෙවියන් වහන්සේ අප එකිනෙකා වෙනුවෙන් සාර්ථක, සෞභාග්‍යමත් සැලැස්මක් සූදානම් කර ඇත. එම දේව සැලැස්මට එකඟව ජීවත් වීමෙන් සාර්ථක, සෞභාග්‍යයෙන් යුතු පවුල් දිවියකට අවැසි භාග්‍යය උදා වේ.

කිතුනු විවාහය කැඳවීමකි, ගිවිසුමකි, සක්‍රමේන්තුවකි. ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප්වහන්සේගේ "කිතුනු පවුල තුළ ප්‍රේමයේ ආනන්දය" (AMORIS LAEITIA) නමැති අපෝස්තලික අනුශාසනාවේ සඳහන් පරිදි, පවුල

අත්විඳින්නා වූ ප්‍රේමයේ ආනන්දය සහාවේ ආනන්දය ද වේ.

**කිතුනු විවාහය / පවුල තුළ සමාජීය වගකීම්**

ආශිර්වාදකාර බන්ධනය තුළින් ගොඩනැඟී ඇති කිතුනු පවුලට සමාජය තුළ සේවයේ ජීවිතයක් ගත කිරීමට ආරාධනාවක් ඇත. කිතුනු පවුලේ ආදර්ශය ශුද්ධවූ පවුල යි. පවුල තුළ ගොඩ නඟා ගන්නා යහපත් සම්බන්ධතා පිටාර ගැලීමක් වශයෙන් අවට සමාජයට ද එහි බලපෑමක් එල්ල වේ. යහපත් සබඳතා තුළ සිටින පවුල අවට සමාජයේ ජීවත් වන අනෙකුත් පවුල් සමඟ ඉතාමත් අලංකාර, සුහද සම්බන්ධතා පවත්වයි. ඒ පවුල්වලට ද ශාරීරික අවශ්‍යතා, සුරක්ෂිතව විසීමේ අවශ්‍යතා, අසල්වැසියන් සමඟ සුහදව සිටීමේ අවශ්‍යතා, ගෞරවය ලැබීමේ අවශ්‍යතා, සම්පූර්ණත්වය කරා යාමේ අවශ්‍යතා ද ඇත. අපට මෙන්ම අනෙක් අසල්වැසි පවුල් වලට ද ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට අපගේ සහය අවශ්‍ය වනු ඇත.

සෑම පවුලක්ම, අවට වෙසෙන පවුල්වල නිදහස, ගෞරවය, ආරක්ෂාව සහ අයිතිවාසිකම් රැකෙන අයුරින් ඔවුන් සමඟ සුහද සම්බන්ධතා පැවැත්වීම අවශ්‍ය වේ. එමඟින් සමාජය ද යහපත් වේ. මෙය කිතුනු විවාහය තුළ අපට කරන ආරාධනයකි.

**අද පවුල මුහුණ දෙන ගැටලු**

වර්තමාන සමාජය තුළ පවතින පවුල් ජීවිත ක්‍රමය පිළිබඳව අවධානය යොමු කරන විට අපට පෙනී යන්නේ, පවුල් ජීවිතයේ මහිමය හඳුනා නොගත් සමාජයක් බව යි. මුළු ලෝකය තුළම ආර්ථික, සමාජීය හා දේශපාලනයමය වශයෙන් ඇද වැටෙමින් පවතින නිසා එහි බලපෑම පවුල් ජීවිතයට ඍජුවම බලපා ඇත. එම නිසා අද පවතින පවුල් ජීවිත ටිකෙන් ටික පරිහානියට පත්වෙමින් පවතින බව දක්නට ලැබේ. ආර්ථික ප්‍රශ්න, දික්කසාද වීම, අනියම් සබඳතාවලට යොමු වීම, මත්ද්‍රව්‍ය භාවිතය, විවාහ නොවී තාවකාලිකව එකට සිටීම, බහු භාර්ය - බහු පුරුෂ සේවනය, සමලිංගික සබඳතා ආදිය නිසා පවුල යන සංකල්පය ටිකෙන් ටික පරිහානියට පත්වෙමින් පවතී. මේ පිළිබඳව ලෝක නායකයින් සහ ආගමික නායකයින්ගේ අවධානය යොමු කළ යුතු ය. අවධානය යොමු වෙමින් පවතින බවද පෙනේ.

**නිගමනය**

පවුල, සමාජයේ මෙන් ම සහාවේ ද කුඩාම ඒකකය යි. තවද කිතුනු පවුල දේව සැලැස්මකි, කැඳවීමකි. පවුල ගැඹුරු ආදර සම්බන්ධතා සමූහයක එකතුවකි. එම උතුම් කැඳවීම අවබෝධ කර ගෙන අප පවුල් දේව ආදරය හා මහිමය ලොවට ප්‍රකාශ කරන මෙවලම් බවට පත්කර ගත යුතු ය. ඒ තුළින් පවුලේ මහිමාලංකාරය අත් දකිමු.

**ඉමාන් අසංජ අබේරත්න**
**බටගම, කඳාන.**

## යුද්ධයට ගිය පුතා

මව්පිය සොයුරු සොයුරියන් හිත තබාගෙන
බඩගිනි පිපාසය කුස තුළ දරාගෙන
තල් අරණේ මිලින විය අවි බදාගෙන
දෙව්ඳුන් ඇති ඔබව අත දරාගෙන

යුද්ධයට යන්න ගිය ඔබ පෙර දවසේ
දෙහිවල දේව අම්මාගේ පල්ලියේ හිටි දවසේ
දෙවියන් නැමැද ඔබ පිටවී ගිය දවසේ
අපේ නිවස පාළු වී ගිය ඒ දවසේ

දරාගෙන ඉන්න බෑ පුතු ඒ දවස
අපේ මව් බිමට එන්න එපා යළි ඒ දවස
සිහියට නැගෙන විට පුතු ඒ දවස
පුදනෙමි පුතේ දෙව්ඳුන් හට ඒ දවස

ඇහෙනවා නිතර මට ඒ කඩු පාර
දැනෙනවා මට නිතර ඒ වෙඩි පාර
කන් දෙක වැසෙයි මගෙ එක පාර
අමතක කරන්න එපා පුතේ දෙව්ඳුන් ගිය පාර

**ඩී. එම්. ජයන්ති පෙරේරා,**
**බෝපිටිය.**

# අභ්‍යන්තර සුවය යනු කුමක් ද?



අප අයත්වන සොබාදහම, දහම, දෙවිඳාණන් අප ජීවිත වලට ඒකාත්මික වන උත්කෘෂ්ට ඇදුරෙකි. එය සත්‍ය වශයෙන්ම අපගේ ශරීරය, සිත් සතන් සුවපත් කරන වෛද්‍යවරයෙක් වැන්න. කල්‍යාණ මිතුරෙක් වැන්න. මෙහිලා අප විසින් අවබෝධ කරගත යුතු දෙයක් ඇත. එනම් ස්වභාව ධර්මයට අයත් වන සියලු දේවල් දෙවි සමිඳුන් අපට සම්බන්ධ කරවන්නකි. වහලුන්ට මිදීමද, අන්ධයන්ට පෙනීමද ලැබෙන බව දන්වන්ටත්, පීඩිත වූවන් මුදන්ටත්, සමිඳාණන් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්ටත් මා එවා වදාළ සේක යනුවෙන් ශුද්ධ බයිබලයේ ලූක් 4:18 හි සඳහන් වේ.

ආදරය කිරීම සඳහා නිදහස් බවක් නොමැතිව, තමන් වෙතට පමණක් යොමු වී, දුක් විඳින, අභ්‍යන්තර මිනිසා ඉවත් කර දෙවි සමිඳුන්ගේ දයාව ඔහු වෙත, ඇය වෙත විනිවිද යන්නට මඟ හදන්නේ කුරුසය මත ජීවිතය පිදූ කිතු හිමියන් ය. උන් වහන්සේ සර්වලෝක සත්ත්වයාට, ආදරය දැක්වීමට ඔහු හෝ ඇය හෝ සිතින් සෑම බාධාවක්ම ඉවත් කරන සේක.

ශාන්තිය ඔබට ප්‍රදානය කර යමි. මාගේ ශාන්තිය ඔබට දෙමි. මා එය ඔබට දෙන්නේ ලෝකයේ දෙන්නාක් මෙන් නොවේ. ඔබේ සිත් කැළඹෙන්නටත් බිය ගන්නටවත් ඉඩ නොදෙන්න ලෙස දැක්විය හැක. ශාන්තිය, සමිඳුන්ගේ සාමය බාහිර හේතු සාධක මුල් කර ගෙන රඳා පවතින්නේ නැත. ශාන්තිය ලැබූ සියලු දෙනා භාග්‍යවන්ත වන අතර ඔවුහු කිසිවක් සම්බන්ධව, කරදර වීමෙන් තොරව සියලු දේ පිළිබඳව තුති පැසසුම් කරති. කොන්දේසිවලින් තොරව එකිනෙකාටත්, දෙවිඳුන්ටත් ආදරය කරන්නට ඔවුන්ට හැකි වේ.

තමන්ට නොමැති දෑ ලබා ගැනීමට ද අධික ලෙස ඔවුන්ට අවස්ථාව තිබේ. තමන් වෙත නොතිබෙන දේවල් අත් කර ගැනීමට, විශාල ලෙස ඔවුන් උනන්දු නොවේ. තමන්ට ලැබී ඇති දේවල් රැක බලා ගැනීමට දුක් ශෝක නොවේ. තමන්ට අවශ්‍ය වන සියලු දේවල් දෙවි පියාණන්වහන්සේ වෙතින් ලැබෙන බව ද තමන්ට අයිති සියල්ල දෙවිඳුන්ගෙන් ලැබෙන බව ද පිළිගන්නා අතර තමන් සතු දේවල් නැති නොවන බව ද ශාන්තිය ලැබුණු අය, ඉතා පැහැදිලිව තේරුම් ගනිති. ශාන්තිය ලැබූ පුද්ගලයා අභිබවා පියාණන් වහන්සේ ගැන ඇදහිල්ල තබති.

අප කුඩා දරුවෙක් මෙන් නොවුවහොත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු වන්නට නොහැකි බව ශුද්ධ ලියවිල්ලේ සඳහන් වේ. එයින් අදහස් කරන්නේ පාපයෙන් ඈත් වී සිටීම යි. කුඩා දරුවා පාපය යනු කුමක්දැයි හඳුනන්නේ නැත. බාලයෙක් මෙන් වීම ද, ළාමක වීම ද අතර වෙනසක් තිබේ. ළාමක පුද්ගලයා, ආත්මාර්ථකාමී, පරිණත භාවයක් නොමැති අයෙකි. කිතු සමිඳුන් පෙන්නුම් කරන බාලයා, තමාගේ කැමැත්තෙන්, තම ආශාවන් ත්‍යාජ කොට, තමන්ගේ ජීවිතයේ සියලු අංශවලට ජේසුස් වහන්සේගෙන් ලැබෙන මඟ පෙන්වීමට පිළිතුරු ලබා දේ. බාලයා විවෘත, ස්වාධීන, නොපැකිළෙන අයෙකි. සත්‍ය වශයෙන්ම දෙවි පියාණන් මෙලොවට අප මවා ඇත්තේ ද එබඳු ස්වාභාවයකට ය. ජේසු තුමා අපගෙන් අපේක්ෂා කරන බාලයකු වීම අසීරු දෙයකි.

අපගේ ජීවිතයේ අතීත සිදුවීම් හේතුකොට ගෙන ආත්මාරක්ෂක වැස්මකින් වැසී සිටින අතර එකිනෙකාගේ අදහස් විශ්වාස කරමු. ඔවුන් අප රවටමින් දී තිබෙන පොරොන්දු වලට විරුද්ධව කටයුතු කළහ. අප ඔවුන්ට ප්‍රේම කළ ද ඔවුහු අප රිදෙන්නට ක්‍රියා කළෝ ය. අනුවණයන් ලෙස අපව හංවඩු ගසමින් අපගෙන් නුසුදුසු ප්‍රයෝජන ලබා ගත්හ. එවන් ජීවිත අත්දැකීම් අපට තිබෙන

නිවැරදි දේව ස්වභාවය සටහන් කිරීමට සමත් ය. එවන් වාතාවරණයක් යටතේ අපගේ ආධ්‍යාත්මික වර්ධනය සඳහා අවශ්‍ය කරන ස්වාධීන, විවෘත සබැඳියාවක් පවත්වා ගැනීම ද දුෂ්කර කාර්යයක් කර තිබේ. අපගේ ආධ්‍යාත්මික සුවතාවයට නියමාකාරයෙන් මඟ පෙන්වන්නේ ජේසුස් වහන්සේගේ සුව කිරීමේ ආදරය ස්පර්ශ කිරීමෙන් පමණි. ඊට වෙනත් විකල්පයක් නැත. අපගේ අභ්‍යන්තරික දරුවා තුළ, මව් කුසයේ පිළිසිඳීමේ පටන් තම හිතකර, අහිතකර සියලු අත්දැකීම් නිදන්ගත වී ඇත. ඔහු හෝ ඇය කෙරෙහි ආරය, පිළිසිඳීමේ සිට මව් කුසේ තමන්ට පියා, මව දැක්වූ අදහස් (පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම, ගබ්සා කිරීමට යොමු වීම) මෙන් ම දෙමවුපියන්ගෙන් ලැබී ඇති, ලැබී නොමැති සබඳතා, දික්කසාදය, විදේශ ගතවීම මුල් කරගෙන මවුපියන් දුරස්ථව සිටීම, මරණය, ත්‍රස්තවාදය, කලකෝලහාල, යුදබිය එයින් මතුවන ක්ෂණික කම්පනය, දූෂණය, පවුලට අයත්වන අයගෙන් ලැබුණු අගය කිරීම, පරිභව කිරීම යනාදී දේවල් බොහෝ ලෙස බලපා තිබෙන බව සත්‍යයකි.

එයින් වැඩි ප්‍රමාණයක් යටි සිත තුළ තැන්පත්ව තිබෙන නිසා එම කරුණු කාරණා උඩසිතට පැමිණෙන්නේ නැත. අපගේ සබඳතා කෙරෙහි ද, මානසික ආධ්‍යාත්මික සහ ශාරීරික සෞඛ්‍යය සම්බන්ධව ද බලපෑම් කරන බව පැහැදිලි කරුණකි. මෙලොවට බිහි වූ සෑම පුද්ගලයෙක් ම ඉහත දක්වා ඇති අත්දැකීම් වලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පාදක කර ගනිමින් තුවාල ලබා තිබේ. එයින් මිදුම ලබා තිබෙන්නේ ක්‍රිස්තුන් වහන්සේ හා දේව මෑණියන් ය.

අප එකිනෙකා සමඟ කටයුතු කිරීමේ දී අපට පාලනය කළ නොහැකි තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු වේ. සුව නොවන රෝග, විෂාදය යනාදී තත්ත්වයන් නිසා අපට ඇතුළාන්ත තුවාල ඇති වේ. සුවය ලබා ගැනීමට ප්‍රථමයෙන් අපට සුවය අත්‍යවශ්‍ය බව පිළිගත යුතු ය. ඒ සඳහා ජේසුස් වහන්සේ ගැන ස්ථිර විශ්වාසයක් තිබිය යුතු ය. එපමණක් නොව සමාව ලබා ගැනීම හා සමාව දීම ස්ථිර ලෙසම පැවැතිය යුතු ය. ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාත්මික වී අතීතයට මුහුණ දීමට සැලැස්වීම අභ්‍යන්තරික හෙවත් ඇතුළාන්ත වශයෙන් සුව සහනය අත්පත් කර ගැනීමේ සුවිශේෂ අංගයක් බැව් ප්‍රත්‍යක්ෂ කරගත යුත්තකි.

ශුද්ධවර මතෙව් 18:19-20 මඟින් තහවුරු කරන ජේසුස් වහන්සේගේ වදන් සිහිපත් කරන අතර ගැඹුරු දයාවකින්, එකමුතුකමකින් නියමිත කණ්ඩායමක් තුළ උපස්ථානය ලබා ගැනීම මීට උචිත වාතාවරණයකි. එසේම සක්‍රමේන්තු ලබා ගැනීම, පෞද්ගලික යාච්ඤාව තුළ ආලෝකයේ සිතුවමට ජේසුස් වහන්සේ හා සංකල්පයෙන් ඉදිරිපත් වීම, විශේෂිත ශුද්ධ ලියවිලි පාඨ කියවීම සහ විශේෂ උපදේශනය මඟින් හා ඒවා පිළිපැදීමෙන් සුවය ස්ථිර වනු ඇත.

**මලින්ත බෝපෙආරච්චි**
**දලුගම, කැලණිය.**

# දෙවි සමිඳුනි ආසිරි දෙන්න

උදේ හවා දෙවිඳුන් හට පහන තියන්න
සුපුවත හැම දින කියවා මෙනෙහි කරන්න
පවුලක් ලෙස එකමුතු වී ජපමාලය යදින්න
දෙවිඳුනි අප පවුල් හැම ආසිරි ගත් වන්න

මමත්වයෙන් තොරව යුතුකම් ඉටු කර ලන්න
උඩගුව අධිමානය මනසින් දුරුකර ලන්න
මනහර ලොවක් දරුවන් හට ඉදිකර දෙන්න
දෙමව්පියන් හට සමිඳුනි ආසිරි බහුලව දෙන්න

දෙමව්පියන් දෙන ඔවදන් සතුටින් පිළි ගන්න
සිප් සත දෙන ගුරුවරුන්ට නිතරම කීකරු වන්න
ඉගෙනුම ලබා යහපත් උගත් දරුවන් වන්න
දූ දරුවන් හැමදෙන සදහම් වරමින් පුරවා ලන්න

දෙමාපියන්ගේ දහදිය ශ්‍රමය මුතු කැට වන්න
ඔවුන් විඳින දුක හිරු දුටු පිනි මෙන් වන්න
මෙත් මුදිතාවෙන් හදවත් ඔවුන්ගේ පුර වන්න
දූ දරුවන් හට දෙවිඳුනි ආසිරි බහුලව දෙන්න

**ජිනවලි ස්වර්ණලතා පීරිස්**

# දෙවියන් වහන්සේගේ ප්‍රේමය මිහිමත ජීවමාන කළ හැකි දැවැන්ත සංවිධානය (සංස්ථාව) මිනිස් පවුලයි.

සර්වබලධාරී දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ස්වභාවයට හා සමානත්වයට මිනිසා මවා වදාළ බව ශු. බයිබලයේ උත්පත්ති පොත සඳහන් කරයි. දෙවියන් වහන්සේ නම් ප්‍රේමය වන බවද උන් වහන්සේගේ අසීමිත දිව්‍යමය ප්‍රේමය කොන්දේසි විරහිතව නිරන්තරයෙන්ම නික්මෙන බවද ශු. ලියවිල්ල වැඩිදුරටත් සඳහන් කරයි.

දෙවි සමිඳාණන් වහන්සේ විසින් මවා ආසිරිගන්වන ලද පළමු මිනිස් පවුල ආදම් ඒව නැමැති අපගේ ආදි මව්පියන්ගෙන් සැදුම්ලත් ස්ත්‍රී පුරුෂ යුවලයි. ඔවුන් මැවීමෙන් පසු ඔවුන් කෙරෙහි දෙවි සමිඳාණන් වහන්සේගේ අභිමතය වූයේ තමන්වහන්සේ ඔවුන්ට ප්‍රේම කරන ලෙසටම ඔවුන්ද තමන් වහන්සේ හට ප්‍රති ප්‍රේමය දැක්වීමත් ඔවුන් දෙදෙනාද එකිනෙකාට එලෙසම ප්‍රේම කරමින් තම දරු පරපුර යහමග ගැන්වීමත් ය. එහෙත් ඒව නමැති අපගේ ආදි මව සාතන්ගේ මුසා බස්වලින් රවටනු ලැබ පළමු පරීක්ෂාවට වැටුණා ය. ඇය තම සමිඳාණන් වූ දෙවි මහෝත්තමයාණන් වහන්සේගේ නියමය හා අභිප්‍රාය හැල්ලුවට ලක්කරමින් තම ස්වාමිපුරුෂයා වන ආදම්වද ස්වකීය බහට නම්මවාගෙන පාපය හා එහි ආදීනව වැළඳගත්තා ය. එසේ එතැන් සිට පාපයේ සිරකරුවන් බවට පත්වෙමින් ඔවුන් දෙදෙනා කළේ සමිඳාණන් වහන්සේ විසින් ඔවුන්ට තෑගි කරන ලද බුද්ධියට හා ප්‍රඥාවට නිගා දෙමින් නිදහස් කැමැත්ත අයුතු ලෙස භාවිත කිරීම ය. එලෙසම දෙවිපියාණන් වහන්සේ විසින් මිනිස් පවුල වෙත ප්‍රදානය කරන්නට යෙදුණු ප්‍රේමයේ මහිමාලංකාරය අහිමි කරගැනීම ය.

එහෙත් කරුණාබරිත දෙවි සමිඳාණන් වහන්සේ තමන් වහන්සේට බද්ධව කීකරුව වන්දනා නමස්කාර කරමින් ගරුබිය ඇතිව එකිනෙකා සමඟ ප්‍රේමයෙන් බැඳී ජීවත් වීම සඳහා සුදුසු මිනිස් දරුවන් දෙදෙනෙකු ලෝකය තුළ සූදානම් කරන්නට යෙදුන සේක. ඒ වූ කලී ජන්ම පාප දෝෂයෙන් නිර්දෝෂව මව්කුස තුළදීම පිළිසිඳ ගැනීමට සලස්වන ලද මරියා නම් ජුදා දූ කුමරිය හා දාවිත් රජුගේ පෙළපතින් පැවතෙන ජුසේ නම් වූ දමිටු පුත්‍ර රත්නයයි. තරුණ වියට එළඹීමෙන් පසුව ඔවුන් දෙදෙනා හට විවාහ ගිවිස ගැනීමට සලස්වන ලද්දේද දේව සැලැස්මට අනුකූලව බව ප්‍රත්‍යක්ෂය. ලෝකාරම්භයේ බිහිවූ ප්‍රථම පවුල වෙලාගනු ලැබූ පාපයේ යදම් බිඳ හරිමින් ලොව පරිශුද්ධවත් කිරීමේ උත්කෘෂ්ඨ ගැලවීමේ කර්තව්‍යය සඳහා තම ඒක ජාතක පුත්‍රයාණන් හට ලොව බිහිවීමේ ශුද්ධවන්ත පරිසරයක් නිර්මාණය කිරීමේ උතුම් කාර්යයද උදෙසා දෙවි පියාණන් වහන්සේ ශු. පවුල නිර්මාණය කළ සේක. ජුසේ හා මරියා යන තරුණ යුවළ උන්වහන්සේ තෝරාග ත්තා ලද්දේ එම ශුද්ධවූ අභිප්‍රාය අනුවය. ධර්මිෂ්ඨ ජුසේ තුමන් තම අනාගත බලාපොරොත්තු පැතුම් ප්‍රාර්ථනා හා සිතැගියාවන් මුලුමනින් ත්‍යාජ කරමින් දේව පුත්‍රයාණන්ගේ සුරැකි පියාණන් හා ගැලවුම්කරුවාණන්ගේ මව් රැජිනිය වන කන්‍ය මරිය තුමියගේ ආරක්ෂක රැකවල්කරු ලෙස ප්‍රේමයෙන් කටයුතු කළ ආකාරය මෙහිලා විස්තර කිරීමට කාලය මිඩංගු නොකරමු.

සාන්ත සභා ඉගැන්වීම අනුව නූතන ලෝකය තුළ ආශිර්වාදකාර බන්ධනය මගින් විවාහ දිවියට එළඹෙන සෑම කිතුනු යුවළක්ම අඹු සැමියන් හා දෙමාපියන් ලෙස ශුද්ධවන්ත දිවි පෙවෙතක් අනුගමනය කිරීමට ගිවිස ගනී. එහෙත් සෑම මිනිස් යුවළකටම ආවේනික මිනිස් හැඟීම් බලාපොරොත්තු ආකල්ප වටිනාකම් ආශාවන් අපමණය, විවිධය, විස්තර කිරීමද අපහසුය. ස්වකීය ප්‍රාර්ථනා සියල්ලෙන් හිස්වී දේව අණසක පිළිපදිමින් තම සහකරුගේ/සහකාරියගේ හා දරුවන්ගේ අවැසියාව සුබසෙත කෙරෙහි පමණක් අවදිවෙමින් ඒවාට ප්‍රමුඛත්වයක් දෙමින් පරිත්‍යාග ශීලී ප්‍රේමයෙන් යුක්තව මුළු දිවිය පුරාම ජීවත් වීම මිනිසෙකුට කොතරම් නම් අසීරුද යන්න විවාහ දිවියේ වසර පනහ ඉක්මවූ අපි මනා ලෙස අවබෝධ කරගෙන සිටිමු.

ශු. පවුල මෙම මිනිස් සීමාවන් අභිබවා කටයුතු

කළේ කෙසේදැයි සිතීම පවා ඇත්තෙන්ම පුදුම සහගතය. තම නිර්මල කුස තුළ වැඩසිටින්නේ ලෝකයේ ගැලවීම වන දේව පුත්‍රයාණන් බව ගාබ්‍රියෙල් දේවදූත පණිවිඩය ප්‍රකාරව මරිය තුමිය නිසැකවම විශ්වාස කළ අතරම ජුසේ තුමන්ද ඒ බව සහතික ලෙස විශ්වාස කළ බව නොඅනුමානය. එම විශ්වාසය තුළ එකිනෙකාට හිමිවිය යුතු ගෞරවය ආදරය සැලකිල්ල නොමඳවම පුද කළහ. එමෙන්ම "දේව පුත්‍රයාණන් අප සමඟ බැවින් කිසිදු බාහිර බලවේගයකට අපි බියපත් නොවන්නෙමු", යන ස්ථිර ඇදහිල්ල ඔවුන් හදවත් තුළ නිබඳවම රජකළ බවද අවිවාදිත ය. මෙසේ ශුද්ධාත්ම මඟපෙන්වීම තුළ ශු. ත්‍රිත්වයට අනුරූපීව දිවිපෙවෙත පූර්ණ ප්‍රේමයෙන් ගත කළ ශුද්ධවූ පවුල අපි අපේ පරමාදර්ශය කොට ගනිමු. දුබල මිනිස් අපද දෙවියන් වහන්සේගේ සමානකමට මවන ලද ප්‍රේමවන්ත දරුවන් වන නිසා උන්වහන්සේගේ ප්‍රේමය අප හදවත් තුළ වර්ධනය වන්නට ඉඩ හරිමු. ඉදිරි දිවි පැවැත්ම යාච්ඤාව පෙරදැරිව දෙවිඳුන්ගේ ශ්‍රී හස්තයට බාර කරමු. ප්‍රේමයේ ආනන්දය හා පවුලේ මහිමාලංකාරය අත්දැකීමට අපිදු එවිට සුදුස්සන් වීම වැළැක්වීමට කිසිදු බලවේගයකට ඉඩ නොලැබෙනු ඇත.

ලැරින් ප්‍රියානි ප්‍රනාන්දු
පහළ දූම්මලසූරිය.

# ආයු කාලයට බලපාන, ඔබේ ඇසුර

ඔබත්, මමත්, අප ජීවිතවලින් සමුගන්නා දිනය නොදන්නා නමුත්, අප මෙලොව ජීවත් වන කාලය, අප ඇසුරු කරන්නන් අනුව වෙනස්වන බව මනෝ විද්‍යාඥයින්ගේ මතය වේ. බෞද්ධ දර්ශනය අනුව ද, සසර දිගු කරන්නේත්, කෙටි කරන්නේත් අපගේ ඇසුර වේ. දෙමාපියන්ගේ ඇසුරෙන් ක්‍රම ක්‍රමයෙන් ඈත් වෙමින්, අප සමාජ ආශ්‍රයට නැඹුරු වීමේ දී, අපට කල්‍යාණ මිතුරන් මෙන්ම පාපතර මිත්‍රයින්වද මුණ ගැසේ. බොහෝ විට පාපතර මිතුරු මිතුරියන් අප නොදැනුවත්වම "බැටළු සම් පොරවාගත් වෘකයින්ගේ වෙස්ගෙන", සුරංගනා කථාවෙන් අප රවටා, ඔවුන්ගේ ඇසුරට අපව පොළඹවා ගනී.

යහපත්, දැහැමි මිත්‍රයින්ගේ ඇසුර, ඔබගේ ආයු කාලය දිගු කරන අතර, අයහපත් මිතුරන්ගේ ඇසුර ඔබගේ ආයු කාලය කෙටි කරන බව මනෝ විද්‍යාඥයින්ගේ මතය වේ. දමිටු මිතුරන්, ඔබගේ සතුරන්ගෙන් පළිගැනීම, ක්‍රෝධය සහ ඊර්ෂ්‍යාව වෙනුවට, ඉවසීම, සමාවදීම, ආදරය දැක්වීම සහ විනිශ්චය නොකිරීමට ඔබව පොළඹවනු ඇත. එහෙත් අදමිටු මිතුරන් ඔබගේ සතුරන්ගෙන් පළි ගැනීමට ඔබව තව තවත් අවුලනවා ඇත. මනෝ විද්‍යාඥයින්ගේ මතය අනුව, ඔබ වැටෙන්නට තරම් ඇල වූ කෙසෙල් ගසක් නම්, ඊට දෙන "මුක්කුව", ඊට ලැබෙන "ඇසුරට" සමාන කෙරේ. ඒ මුක්කුව, ඇල වූ පැත්තටම, තව තවත් ඇල වෙන්න සවි කරන්නන් අධර්මිෂ්ඨ මිත්‍රයින්ට සමාන කරන අතර, වැටෙන්නට නොදී සවි කරන නිවැරදි මුක්කුව, ධර්මිෂ්ඨ මිත්‍රයින්ට සමාන කරනු ලබයි. අද සමාජයේ පාපතර මිත්‍රයින්, මේ ලෝකයේ දිරාපත්වන සැප සම්පත් අයථා ලෙස ලබා ගැනීම, යහපත් අරමුණක් මෙන් ඔබව රවටා ඒවා ලබා ගැනීම සඳහා අයහපත් ක්‍රියා සිදු කිරීමට ඔබව පොළඹවා, සමාජය දූෂණය කරන බේබද්දන්, පාතාලකරුවන්, කුඩු ජාවාරම්කරුවන්, මංකොල්ලකරුවන් හෝ මිනීමරුවන් බවට පවා පත් කොට, අවසානයේ දී අකල් මරණයට ගොදුරක් කර, ඔබගේ කිසිදා නොදිරන ආත්මයේ ස්වර්ග රාජ්‍යයේ උරුමය පවා නැති කරනු ඇත. එබැවින් ඔබේ "ඇසුර",

ඇ - ඇද නැති පටු මාර්ගයේ ගමනාන්තය දක්වා,
සු - ස්වර්ග රාජ්‍යයට උරුමක්කාරයකු වීමට,
ර - රවටන නපුරාගෙන් මිදී,

ඔබේ ආයු කාලය දිගු කර ගනිමින්, අභියෝගාත්මකව, ඔබේ මතකයන්, මහත් අභිමානයෙන් පොලීසිය, උසාවිය සහ සිරගෙය අමතක කොට; ඔබගේ ආදරවන්තයින්ගේ සිත් සංසිඳවා ඔවුන්ගේ කඳුළු, සිනාවට නැගීමට ස්ථිර අධිෂ්ඨානයක් ගත් ඔබට ආයුබෝවන්!

අයිවෝ හපුආරච්චි
හපුගොඩ, කඳාන.

# පිරුණු කුටුම්බය (කෙටි කතාව)

වෛද්‍ය ඇන්ටන් ද සිල්වා පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගෙන ගියේ හුදෙක් මුදල් ඉපයීම සඳහා ම පමණක් නොවේ. බිරිඳගේ අකල් මරණයත්, පුතුගේ විදේශගතවීමත් නිසා ජීවිතයට එකතු වූ තනිකම මකා ගැනීමට ය. නොමිලයේ ලබා දෙන කිසිදු සේවයකින් මිනිසා සෑහීමකට පත් නොවන නිසාත්, ඖෂධවල වටිනාකම දිනෙන් දින ඉහළ යාම නිසාත් ඔහු සාධාරණ අය කිරීම් ක්‍රමවේදයක් භාවිත කළේ ය. ජනතාව අතර ඔහු ප්‍රචලිත වූයේ 'පින් දොස්තර' නමිනි. කාගෙත් නොමඳ ආදරයට ඔහු පාත්‍ර වූයේ ඔහුගේ වූ කාරුණිකභාවය සේම රෝග සුව කිරීමේ අපූරු න්‍යාය හේතුවෙනි. ඔහු හමුවට එන රෝගීන්ගේ ශාරීරික අසීරුතා සුව කරන අතරතුර ඔවුන්ගේ මානසික සුවය ගැන වැඩි අවධානයක් දුන්නේ ය. අවට විසූ සමහර වියපත් අය සැඳෑ සමයේ දී ඔහු හා අල්ලාප සල්ලාපයේ යෙදෙන්නේ රෝගීන් නොමැති අවස්ථාවලදී ය. කාගෙ ප්‍රශ්නවලටත් විසඳුමක් ඔහු සතුව තිබීම නම් මහා ආශ්චර්යයකි.

දිනක් සුරුපී තරුණියක ඔහු හමුවට ආයේ මහත් කලබලයකින් මෙනි.

"වාඩි වෙන්න... දුව... මොකක් ද ප්‍රශ්නය? මුලින්ම සන්සුන් වෙන්න..."

ඇයගේ මුහුණ මත හැඟීම් දහසක් පොර බදනු දුටු වෛද්‍යවරයා තම සහායිකාව ඇමතුවේ ය.

"නර්ස්... මේ දරුවට වතුර ටිකක් දෙන්න..."

ඇය තරුණියට වතුර වීදුරුවක් දුන්නා ය. තරුණිය එක හුස්මට වතුර බිව්වා ය.

"හරි... ඔයා දැන් නිවිලා නෙ... කියන්නකො... මොකද ආවේ?"

තරුණිය මඳක් ඇඹරුණා ය.

"ඩොක්ටර්... මගෙ බඩේ අමාරුවක්... වමනෙ යනවා..."

"ආ! අපි ඕක සනීප කර ගනිමු... කවදා ඉඳලද.... අපත්‍ය දෙයක් කෑවද?"

ඔහු ප්‍රශ්නකරණය ආරම්භ කළේ ය. නළාව තබා පරීක්ෂා කළේ ය.

"ම්... ම්... නර්ස් මෙයාව ඇඳට ගන්න..."

සියලුම පරීක්ෂාවන් නිම විය.

"දුව... බයවෙන්න දෙයක් නෑ.... ඔයා අම්මා කෙනෙක් වෙන්නයි යන්නේ...?"

"නෑ... නෑ... එහෙම වෙන්න බෑ..."

ඇයගේ මුහුණ විරූප විය. කොපුල් පුරා කඳුළු ය. වෛද්‍යවරයාට කරුණු අනුමාන කළ හැකි විය.

"ඒත්... ඒක තමා ඇත්ත... දරුවෝ... සතුටු වෙන්න... දරුවන් ලැබීම මොන තරම් සම්පතක් ද?"

"ඒත්... ඒත්... මං කසාද බැඳලා නැහැ නෙ..."

"කසාද බඳින්නම ඕනෑ නැහැනෙ ළමයෙක් ලැබෙන්න... දැන් ඔයාට යථාර්ථයට මුහුණ දෙන්න වෙනවා... ඔයාගෙ පෙම්වතාට මේ ගැන කියන්න...". ඈ හඬා වැටුණා ය.

"අනේ... ඩොක්ටර්... එහෙම වෙන්න බෑ..."

"පුරුෂයෙකුගේ සම්බන්ධයකින් තොරව දරුවෙකුට උපත දුන්නෙ එකම කාන්තාවක් ගැන පමණයි මා දන්නේ... ඒ තමා මරියතුමී... අහලා තියෙනවා ද? එතුමියට ඒ..."

"එපා... එපා... මට කාගෙ කතාවකින්වත් වැඩක් නෑ... අනේ ඩොක්ටර් මට දරුවෙක් එපා... මගෙ දෙමව්පියො මාව මරලා දාවි... අනේ මේක අයින් කරලා දෙන්න.. කරුණාකරලා..."

"ගබ්සාව කියන්නෙ මිනී මැරුමක්... මට නම් ඒ පාපයට හවුල් වෙන්න බෑ... ඒ වගේ දේකින් ඔය ළමයාගේ ජීවිතයත් අවදානමක වැටේවි... කොහොමත් මම කරන්නේ ජීවිත ජීවත් කරවන එක මිස, විනාශ කිරීම නෙවේ..."

අනේ... ඩොක්ටර් ප්ලීස්... මම මහා පිටිසර ගමකින් මෙහෙ ආවේ... මං රැවටුණා... මගෙ අම්මලා දැන ගත්තම... මොනවා වේවි ද?"

"හරි... අපි මෙහෙම කරමු... ඔයාගේ පෙම්වතාව එක්කන් එන්න... මම කතා කරලා විවාහයට පොළඹවා ගන්නම්..."

"බැහැ... සර්... එයා දැනටමත් විවාහකයි..."

"ඒකත් එහෙම ද... ඒත් මට දරුවා නැති කරන්න නම් බෑ... නර්ස් මෙයාව අර අනෙක් කාමරයට එක්කන් යන්න... ඔය ළමයා ටිකක් නිවී සැනහිල්ලේ හිතන්න..."

නර්ස්, ඇයව අතිරේක කාමරයට කැඳවා ගෙන ගියා ය. කාමරයේ බිත්ති පුරාම වූයේ සුන්දර බිළිඳු පින්තූරයන් ය. කුඩා ටීපෝව මත මව් දරු සබඳතා පිරි සඟරා ය.

"ඔයාට පුළුවන් ඔය සෝෆාවේ හාන්සි වෙන්න... නිදහසේ හිතන්නකො... මම තව ටිකකින් කන්න මොනවා හරි ගෙනෙන්නම්..."

හෙදිය පිටව ගියා ය. වෛද්‍යවරයා තම කාර්යයන් නිම කර හෙදිය සමඟ තරුණිය හමුවට ගියේ ය.

"දැන්... ඔය දුවගේ හිත සන්සුන් ද?"

"තරමක්... මට කියනවා ද අර පුරුෂයෙකු නැතිව දරුවෙකු වැදූ කාන්තාව ගැන...?"

"ආ! ඔබ කිතුනුවෙකු නොවන හැඩයි... ඒ තමා මරියතුමී... ජේසුගේ අම්මා..."

වෛද්‍යවරයා මරිය තුමියගේ දරු උපත ගැන විස්තර කළේ ය.

"මරිය තුමීත් එහෙනම් මුලදී දුක් වෙන්නැති... බය වෙන්නැති... ඒත්! ඇයට දේව රැකවරණය තිබුණනෙ... මට කවුද ඉන්නෙ... එයාට සුරැකි පියෙකුත් ඉඳලා... එතකොට පවුල සම්පූර්ණයිනේ... කිසි ප්‍රශ්නයක් නැහැ නෙ... මං... මං... තනි වෙලා... මගෙ දරුවා අවජාතකයි... එතකොට... අවජාතකයා කියලා දරුවට අපහාස කරයි... ඩොක්ටර්..."

"ළමයින් ජාතක අවජාතක කියලා දෙකොට්ඨාසයක් නෑ... හැම ළමයම ජාතකයි... අපි ඔය දරුවටත් සුරැකි පියෙක් හොයා ගනිමු... ළමයෝ..."

"එහෙම කවුද අනුන්ගේ දරුවෙක් එක්ක මාව භාර ගන්නෙ... මට දැන් බෝඩිමට යන්නත් බෑ... රස්සාවට යන්නත් බෑ... මං මොකද කරන්නේ?"

"කලබල වෙන්න එපා... හැම ප්‍රශ්නයටම විසඳුම් තියෙනවා... හිත හදාගන්න..."

"අනේ... මම දන්නෙ නෑ... මට මේ පින්තූර දකිද්දී වාවන්නෙ නෑ... මම දරුවා නැති කරගන්නෙ නෑ... මං හදා ගන්නවා..."

"අන්න හොඳ තීරණයක්... හරිම සතුටුයි... ඔය ළමයාට මාස තුනක් විතර යනතුරු ඔය විදියටම රැකියාවට යන්න... ඊට පස්සෙ මං ඔයාව කන්‍යා සොහොයුරියන්ගේ ආයතනයකට යවන්නම්... කැමති ද?"

"කැමතියි... මං මෙච්චර කල් දෙවියන් හඳුනාගෙන හිටියෙ නෑ... අද තමා මරිය තුමීගේ කතන්දරයෙන් දෙවියන් ගැන දැන ගත්තේ... හැබැයි මම දෙවියන් ව දැක ගත්තේ ඔබ තුමාගෙන්..." ඇය යළි වැළපෙන්නට පටන් ගත්තා ය. හෙදිය ඇය අස්වසාලීමට කටයුතු කළේ මවක පරිද්දෙනි.

කාලය ගෙවී ගියේ ය. වෛද්‍යවරයා මහලු වියට පත් වූයේ ය. වෛද්‍ය මධ්‍යස්ථානය වැසී ගියේ ය. වෛද්‍යවරයා තම නිවසේ මෙහෙකරුවෙකු සමඟ කාලය ගත කළේ ය. දිනක් උදේ වරුවේ ඔහු සක්මන් කරමින් සිටිය දී නිවෙස ඉදිරිපිට කාරයක් නැවතිණ. අවුරුදු අටක පමණ හුරුබුහුටි පුතෙකු සමඟ යුවළක් ඔහු අබියසට පැමිණියේ ය.

"ඩොක්ටර් ඇන්ටන් ද සිල්වා...?" විමසුවේ පැමිණි මහතා ය.

"ඔව්... හැබැයි දැන් මං ප්‍රතිකාර කරන්නේ නම් නැහැ... යමු ඇතුළට... වාඩිවෙන්න..."

සියල්ලෝ ම ආලින්දයේ අසුන් ගත්හ.

"ඉතින්... දැන් කියන්නකො..."

කාන්තාව වෛද්‍යවරයා අසළට විත් දණින් වැටුණා ය. වෛද්‍යවරයා විමතියෙන්,

"මී... මී... ඇයි මේ... මට..."

17 වන පිටුවට ...

කැතරින් ගුණවර්ධන

# ශුද්ධවූ පවුල වත්මන් පවුල් සංස්ථාවට පූර්වාදර්ශයක් ලෙස

මනුෂ්‍ය වර්ගයාගේ අඛණ්ඩ පැවැත්ම තීරණය කිරීමේ ප්‍රධාන සාධකයක් ලෙස 'පවුල' නමැති සංකල්පය හඳුනාගත හැකි අතර කිතු දහම තුළ පවුල නමැති සංකල්පයට වඩාත් වැදගත් ස්ථානයක් හිමි වේ. මන්ද කතෝලික ආගම වනාහි ප්‍රේමය වැදගත්ම ධර්මතාවය ලෙස පිළිගනු ලබන අතර කතෝලික ආගමේ අත්තිවාරම හෙවත් පදනම වනුයේ ප්‍රේමය යි. මෙලෙස ප්‍රේමය ආරම්භ වන කුඩාම ඒකකය පවුල වන අතර ආශිර්වාදකාර බන්ධනය නමැති උතුම් වූ දේව ප්‍රසාද නිධානය හරහා අන්‍යෝන්‍ය ප්‍රේමය තුළ එක් වන යුවළ පවුල නමැති කුඩාම ඒකකය ගොඩනගමින් තම දරුවන් ද ප්‍රේමය තුළ ඇති දැඩි කරයි.

කතෝලිකයන් වන අප සැම ශුද්ධවූ පවුලට වැඩි අවධානයක් යොමු කරමින් අප පවුල් සංස්ථාවලට එමගින් ගත හැකි පූර්වාදර්ශය සාකච්ඡා කිරීම වඩාත් යෝග්‍ය වන්නේ ය. නාසරෙත්හි ශුද්ධවූ පවුල මගින් ගත හැකි වැදගත්ම ආදර්ශය වනුයේ දේව කැමැත්තට අවනත වීම යි. මන්ද මරියතුමියට හා ජුසේතුමාට තිබූ සැලසුම් බිඳලමින් ඒ අතරට ජේසුස් වහන්සේගේ පැමිණීම දෙවියන් වහන්සේගේ කැමැත්ත වූ බැවින් ඔවුන් දෙදෙනා එම දේව අණට කීකරු විය. ජෝසප් නම් මනුෂ්‍යයාට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යාවක් වන මරියතුමීට ජේසුස් වහන්සේගේ උපත දැනුම් දුන් පසු මරියතුමී කතා කරමින් බලන්න මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටු වේවා" (ලූක් 1:38) යනුවෙන් පවසමින් දේව කැමැත්තට හිස නැමීය. එසේම ජුසේතුමාට මරියතුමී ශුද්ධාත්මයාණන් අනුහසින් ගැබ් ගෙන ඇති බව සිහිනයකින් දැනුම් දුන් පසු "ජෝසප් නින්දෙන් අවදි වූ විට සමිඳාණන් වහන්සේගේ දූතයා ඔහුට අණ කළ ලෙස සිය බිරිඳ කැන්දාගෙන ගියේ ය" (මතෙව් 1:24). මෙසේ ජුසේතුමා ද දෙවි වදනට හිස නැමූ ආකාරය අපට හඳුනාගත හැකි ය. එසේම ජේසුස් වහන්සේ දේව තාත්තාගේ වචනයට අවනතව, මුළු මහත් මිනිස් සංහතියේ ගැලවීම උදෙසා මෙලොවට පැමිණ, කුරුස ගසේ දී තම දිවි පූජා කරන ලද්දේ "පියාණෙනි මාගේ කැමැත්ත ලෙස නොව ඔබ වහන්සේගේ කැමැත්ත ලෙස සිදු වේවා" යනුවෙන් පවසමින් ය.

එසේම අන් අයගේ විපතේ දී සංවේදී වීම ශුද්ධවූ පවුල තුළින් ගත හැකි තවත් ආදර්ශයකි. කානා නුවර මංගල උත්සවයේ දී මිදි යුෂ හිඟ වූ විට මරිතුමිය, ඔවුන් පත් වන්නට යන අපහසුතාවය පිළිබඳව සංවේදී සිතින් යුතුව තම පුත්‍රයාණන්ට ඒ බව දැනුම් දුන් අතර ජේසුස් වහන්සේ තම මවගේ ඉල්ලීමට කීකරුව වතුර වයින් බවට පත් කර උන් වහන්සේගේ පළමු ප්‍රාතිහාර්ය සිදුකරමින් ඔවුන්ට උපකාර කළ සේක.

එසේම ශුද්ධවූ පවුල දිවි ගෙවූයේ රෝස මල් යහනාවක නොව, විවිධ බාධක දුක් කම්කටොළු අභියෝග තුළ ඔවුන් ඒකත්වයෙන් හා විශ්වාසයෙන් යුතු ව කටයුතු කරමින් සැම අභියෝගයකටම මුහුණ දෙමින් ය. ජුසේ තුමා දේව මාතාවන් කැටුව බෙත්ලෙහෙමට පිටත් වීම, දිළිඳු ගවහලක ලොව ගැලවුම්කරුවාණන් වන ජේසු බිළිඳාණන්ව බිහිකිරීමට සිදු වීම, හෙරොද් රජුගෙන් ජේසු බිළිඳාණන්ව බේරා ගැනීමට මිසරයට පිටත්ව යාම, දේව මාළිග ාවේ දී ජේසුස් වහන්සේ නැතිවීම, තම එකම පුත්‍රයාණන් වන ජේසුස් වහන්සේ කුරුසයේ මරණයට පත් කිරීම ආදී අභියෝග ඇ සකට ශුද්ධවූ පවුල විශ්වාසයෙන් යුක්තව ඒකත්වයෙන්, ප්‍රේමය කරණ කොටගෙන පවුලක් ලෙස මුහුණ දෙමින් දේව අණට යටත් විය.

මෙලෙස අප සැම පවුල තුළ මවක්, පියෙක්, දුවෙක්, පුතෙක් ලෙස ශුද්ධවූ පවුලේ ආදර්ශය අනුව ප්‍රසන්න පවුල් ජීවිතයක් ගත කරන්නේ ද යන්න මොහොතක් සිතා බලමු. කිතුනු පවුල යන්න සැබෑ ප්‍රේමය කරණ කොට ගෙන නිර්මාණය වන්නක් වේ. ශුද්ධවූ පාවුලු තුමා විසින් ලියන ලද කාව්‍යමය ඡේදයක්

තුළ අපිට සැබෑ ප්‍රේමයේ ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි ය. "ප්‍රේමය ඉවසිලිවන්ත ය. කරුණාවන්ත ය. ප්‍රේමය ඊර්ෂ්‍යා වන්නේ නැත. පාරට්ටු කරගන්නේ නැත. උඩඟු වන්නේ නැත. ප්‍රේමය අවිනීත නොවේ. ආත්මාර්ථකාමී නොවේ. හනික නොකිපේ. නපුර සිතේ ධාරණය කර නොගනී. ප්‍රේමය අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවී හරි දේ ගැන ප්‍රීති වෙයි. ප්‍රේමය සියල්ල උසුලයි. ප්‍රේමයෙහි විශ්වාසයට ඉමක් නැත. බලාපොරොත්තුවට නිමක් නැත. ඉවසීමට අගක් නැත" (1 කොරින්ති 13:4-7). මෙලෙස ප්‍රේමය පදනම් කරගෙන අප සෑම ශුද්ධවූ පවුල මෙන් ඉවසීමෙන්, කාරුණිකව, උඩඟු නොවී, ආත්මාර්ථකාමී නොවී, විශ්වාසයෙන් හා බලාපොරොත්තුවෙන් යුක්තව පවුල් තුළ ක්‍රියා කිරීමට උත්සාහ කළ යුතු ය.

එසේම එකට යදින පවුල එකට සිටී යන්න ප්‍රසිද්ධ කියමනකි. එනම් පවුලක් ලෙස යාච්ඤා කිරීම තුළ, පවුලක් ලෙස දිව්‍ය පූජාවට සහභාගි වීම තුළ එම පවුල එකම දම්වැලක පුරුක් ලෙස කැඩී බිඳී විසිරී යාමට ඉඩ නොදී එකට බැඳ තබාගත හැකි ය. මන්දයත් "යම් තැනක දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස්ව සිටින්නේ ද එතන ඔවුන් මැද මමත් වැඩ සිටිමි" (මතෙව් 18:20) යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කර ඇති බැවිනි. මේ අනුව යාච්ඤාව තුළ ඇතිවන ඒකත්වය වනාහි පවුලක යහපැවැත්මේ මුදුන් මුල වන අතර එය බිඳී ගියහොත් කිතුනු පවුලේ සමාදානය, සමගිය බිඳී යනු ඇත.

මෙලෙස අප සෑම ශුද්ධවූ පවුලේ ආදර්ශය අනුව යමින් අප පවුලේ සිදුකරන විවිධ භූමිකා තුළ දේව කැමැත්තට හිස නමමින්, පවුලේ සෙසු සාමාජිකයන්ට කීකරුව, පවුල තුළ මෙන්ම ඉන් පිටත සමාජය දෙස සංවේදී වෙමින්, අපගේ උපකාර අවැසි මොහොතේ උපකාර කිරීමට පසුබට නොවී, අප ජීවිතයට පැමිණෙන විවිධ ප්‍රශ්න අභියෝග බාධක හමුවේ නොසැලී, දේව විශ්වාසයෙන් යුතුව, ඒකත්වයෙන් හා ඉවසීමෙන්, ප්‍රේමය පතුරුවමින් දෙවියන් වහන්සේට ප්‍රසන්න ශුද්ධවත් පවුල් ජීවිතයක් ගත කිරීමට උත්සාහ කරමු.

**නීතිවේදී ශෙලින්ඩා සමරසිංහ**

## පිරුණු කුටුම්බය (කෙටි කතාව), 15 වන පිටුවෙන් ...

පුරුෂයා පුතු කැටුව මිදුලට ගියේ රඹුටන් ගස පෙන්වමිනි.

"සර්ට මාව මතක නැතිව ඇති... මං ඔබ තුමාව හොයාගෙන ආවෙ ස්තුති කරන්න... මගේ ලස්සන පවුල් දිවියට ආශිර්වාද ගන්න..."

ඇය අතීත ස්මරණයන් විස්තර කළා ය.

"ඉතින්... කන්‍යාරාමයේ දී සිස්ටර්ලා මට හොඳට සැලකුවා. සුරැකි පියෙකුත් සොයා දුන්නා... දැන් අපි තුන්දෙනා පවුලක් වෙලා අවුරුදු හතක්... පුතාට වයස අවුරුදු අටක්... ඔබතුමා මට මරියතුමී ගැන කියා නුදුන්නා නම්...?"

වෛද්‍යවරයා මහත් සතුටට පත් වූයේ ය.

"කෝ... කෝ... සිරිදාස මෙහෙ එන්න... තේ ටිකක් ලෑස්ති කරන්න... ඔය ළමයා එන්නකො මෙහාට..."

පිය පුතු දෙදෙන යළි නිවෙස තුළට පැමිණියහ.

"ඉතින්... මේ මහත්තයා කොහෙද?"

"මම අනුරාධපුරයෙන්... අපට ඕස්ට්‍රේලියාවට රැකියා අවස්ථාවක් ලැබුණා. ලබන සතියෙ පිටත් වෙනවා... මෙයා නිතරම ඔබතුමා ගැන කියනවා... ඒකයි මේ හොයාගෙන ආවේ..."

"හරිම හරි සතුටුයි... සියලු දේම දෙවි පියාණන්ට භාර දෙන්න... ජුසේ තුමායි, මරියතුමී යි, ජේසු පුතා යි තමා ශුද්ධ වූ පවුල... ඒ ආදර්ශයට ගෙන ජීවිතය ජය ගන්න..."

තුටු පිළිසඳරකින් පසුව ඔවුහු අලුත් ලෝකයේ අරුමැසිය විඳිනට පිටත්ව ගියහ. වෛද්‍යවරයා සමිඳාණන්ට ප්‍රශංසා ගීයක් ගයමින් යළි සක්මනෙහි යෙදුණේ ය.

# ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී මුහුණේ
# ගෝනවිල ගරු හෙලේනා තුමිය



ගරු හෙලේනා තුමිය ජේසු සමිඳුන්ට දක්වන ලද ප්‍රේමයත් ඇයගේ වෘතශුද්ධ භාවය හා ශුද්ධවන්ත ජීවිතයත් නිසා 1870 ඔක්තෝබර් මස 17 වන දින එතුමියට ශ්‍රී වණ කැළැල් ලැබිණි. එතැන් පටන්, සෑම සිකුරාදා දිනකම තුන් වරක් කුරුසියේ ඇණ ගැසුවාක් මෙන් එතුමිය බිම වැතිර සිටියා ය. එම අවස්ථාවල ඇය පරවසම් වූ ආකාරයක් දක්නට ලැබිණි. වණ කැළැල්වල වේදනාව හා ශාරීරිකව නිරාහාරව සිටියත් ධර්මෝපදේශය ඉගැන්වීම සඳහා දේවස්ථානයට පයින් ගියා ය. මේ කාලය වන විට, ගෝනවිල ප්‍රදේශයේ කතෝලිකයන් බොහෝ දෙනෙක් බලි තොවිල් හා යක්ෂ ක්‍රියාවලට යොමු වීම හේතුවෙන් කතෝලික ආගම පිරිහීමට ලක් වී තිබුණේ ය. ඇය ඒවාට තරයේ විරුද්ධ වී ඔවුන්ගේ ගෙවල් බැහැදැක මනස්තාප වීමට හා දේවස්ථානයට පැමිණීමට උනන්දු කළා ය.

ඇයගේ පියා විවාහය සඳහා කතෝලික ආගම වැළඳ ගෙන සිටිය ද, පසුව යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් කටයුතු නැවත ආරම්භ කළේ ය. මවගේ උත්සාහය නිසාම පවුලේ පුත්‍රයන් හතර දෙනා සහ දියණියන් තිදෙනා ක්‍රිස්තියානි කළේ ය. හෙලේනා පවුලේ බාලයා වූ අතර 1848 ඔක්තෝබර් මාසයේ ගෝනවිල දී උපත ලැබුවා ය. ඇය කුඩා කාලයේ සිටම ආගමික කටයුතුවලට සම්බන්ධ වූ අතර, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට ඉතා ආශාවෙන් වයස සම්පූර්ණ වන තුරු බලා සිටියා ය. පියා ඇයගේ ආගමික කටයුතුවලට විරුද්ධ වූ අතර, ඇයව ඒවායින් ඈත් කිරීම සඳහා මාකොළ සිටි ඔහුගේ නෑදෑයින් වෙත යැවීය. ඇයගේ සොහොයුරියන් දෙදෙනා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් වන බව බෝලවත්තෙන් පැමිණි නෑදෑයෙකුගෙන් දැනගෙන, නැන්දා කෙනෙක් සමඟ බෝලවත්තට පැමිණියා ය. ඇය සොහොයුරියන් සමඟ ආගම ඉගෙන ගෙන, හොඳ සූදානමකින්, යුතුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හා අභිවෘද්ධි ආලේපය ලබා ගත්තා ය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගන්නා සෑම දිනකම ජේසු ස්වාමීන් වහන්සේට තිබෙන ප්‍රේමය වැඩි වී, උන් වහන්සේට සම්පූර්ණයෙන් කැපවී ජීවත් වීමේ ආශාව ඇති විය. තම පියාගෙන් හා පියා අනුව ගිය වැඩිමහල් සහෝදරයාගෙන් දිව්‍ය පූජාවට යාමට හා ආගමික කටයුතු කිරීමට, බාධා ඇති විය. සමහර දිනවල ඇයට පල්ලි යාමට බැරිවන ලෙස ඇඳුම් පැළඳුම් හැංගුවේ ය. තවත් අවස්ථාවල දිව්‍ය පූජාවට නොයන ලෙස තරවටු කළේ ය.

මහ සිකුරාදා දිනක තුන් පැය ධ්‍යානයට එතුමිය දිනක් බෝලවත්තට ගියා ය. මිනිසුන් යොදා ගෙන ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය එහිදී පෙන්වන ලදී. ජේසුස් වහන්සේට ගසමින් වද වේදනා දීම හා කටු ඔටුන්නක් තබා කුරුසියේ ඇණ ගසා උකුත්වීමත්, දැක එතුමිය දැඩි සේ කම්පාවට පත් වූවා ය.

ඇය හැම විටම පියාගේ තොවිල්, මන්ත්‍ර වැනි දේ වලට විරුද්ධ වූවා ය. දිනක් ඇගේ සහෝදරයා ඔප්පු කිරීමට සූදානම් කර තිබූ භාණ්ඩ අත ගා ඒව අපවිත්‍ර කළ නිසා, කෝටුවකින් ඇයට සිහි නැතිවෙන තෙක් ගැසුවේ ය. හිරිහැර කළ විට හෝ වේදනා පැමිණ වූ විට ඇය කිසි තරහක් නොපෙන්වා සියල්ල සතුටින් විඳ දරා ගෙන, ඔවුන්ගේ සිත් හැරීම සඳහා ඔප්පු කරමින්,

යාච්ඤා කළ අතර, හෙලේනා තුමියගේ ජීවිතය දුක් කරදර වලින් පිරී තිබුණේ ය.

ඇයගේ ශ්‍රී වණ කැළැල් සහ පරවසම් වීම, ප්‍රසිද්ධවන විට, බොහෝ දෙනා එය දැක බලා ගැනීමට පැමිණියේ ය. එතුමිය අනිත් අයට වඩා වෙනස් බවත්, ඇයගේ ශුද්ධවන්ත ජීවිතයත් දැක ඇය ශුද්ධවන්තියක් ලෙස පිළිගනිමින්, ඔවුන්ගේ ලෙඩ දුක් කරදර ඇයට කියමින්, යාච්ඤා කරන ලෙස ඉල්ලා සිටියහ. ඇයව හමුවීමට පැමිණෙන අයට සාවධානව ඇහුම්කන් දී ඒ අයව තමන්ගේ ගැටලු නිරාකරණයට ගැනීමට අවවාදකර, ලෙඩ රෝග ඇති අය උදෙසා යාච්ඤා කළා ය. ඇයගේ මධ්‍යස්ථ පිහිට ලැබී බොහෝ රෝගීන් සුව විය. 1925 දී, ඒ. කේ. ඇග්නස් පෙරේරා නැමැති දැරිය ඇස් රෝගයකින් ඇස් රතු වී නොනවත්වා කඳුළු ගලමින් බොහෝ වේදනා වින්දා ය. ඒ කාලයේ, වෛද්‍යවරුන් හා බෙහෙත් නැති නිසා, ඇගේ දෙමව්පියන්, කරත්තයක ඇයව ගෝනවිල හෙලේනා තුමිය ළඟට ගෙනාවේ ය. එතුමිය දැරියගේ ඇස්වලට අත් තබා යාච්ඤා කරන ලදී. ගෙදර ගිය පසු ඇස් රෝගය සම්පූර්ණයෙන් සුව විය. මෙය සිදු වූයේ හෙලේනා තුමියගේ මධ්‍යස්ථ පිහිටෙන් බව පවුලේ අය ද අසල්වැසියන් ද විශ්වාස කළහ. මෙය ඇග්නස් නමැති තමාගේ අම්මා තමාට කියූ බව ඇගේ පුතා ප්‍රකාශ කළේ ය.

හෙලේනා තුමියගේ ජීවිත කාලය තුළ දී මෙන් ම මරණින් පසුවත්, බොහෝ දෙනා එතුමියට යාච්ඤා කර පිහිට ලබා ඇත. එතුමිය බොහෝ දුක් වූයේ, තමාගේ පියාගේ ආත්මය වෙනුවෙනි. ඇය වින්ද වේදනා තාත්තාගේ සිත් හැරීම වෙනුවෙන් ඔප්පුකර, දෙවියන් වහන්සේට කන්නලව් කළා ය. ඇයගේ යාච්ඤාව නිසා දෙවියන් වහන්සේ ඔහුට අසනීප වීමට සලස්වා, පියතුමා පැමිණ පාප උච්චාරණය අසා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දෙන ලදී. ඒ සමඟම, ඇගේ සහෝදරයා ද ඇයගේ ශුද්ධවන්තභාවය නිසා පැහැදී සිත් හැරී එතුමියට උදව් වීමට පටන් ගත්තේ ය.

1931 පෙබරවාරි 8 වන දින, එතුමිය ස්වර්ග ස්ථ වීමෙන් පසු, කොළඹ අගරදගුරු තුමාගේ විශේෂ අවසරය මත මෘත ශරීරය ගෝනවිල දේවස්ථානයේ තබා ගෞරව දක්වන ලදී. එම අවස්ථාවේ දේවස්ථානය රෝස මල් සුවඳින් පිරී ගියේ ය. එතුමියගේ වණ කැළැල්වලින් ගලන ලද රුධිරය සමහර අය පුළුන් කැබලිවලට ගෙන, ගෙවල්වල තබා ගත්හ. ගරු පූජාප්‍රසාදීන් වහන්සේලා, ගරු පැවිදි සොයුරියන් හා විශාල ගිහි ජනතාවකගේ සහභාගිත්වයෙන් මෘත ශරීරය ගෝනවිල සුසාන භූමියේ තැන්පත් කරන ලදී. ගෝනවිල ගමේ අය සහ ඇගේ නෑදෑ පිරිස ඇයගේ ශුද්ධවන්ත ජීවිතයෙන් පැහැදී, ගෝනවිල සුසාන භූමියට පැමිණ යාච්ඤා කරති. ඇයගේ ජීවිතය අපට පෙන්වා දෙන්නේ අපගේ කුරුස රැගෙන ජේසුස් වහන්සේ අනුගමනය කිරීමට ඇති කැඳවීම යි. එය, ගරු හෙලේනා තුමියගේ මාර්ගෝපදේශකයා වූ අප සමිඳාණන් වන ක්‍රිස්තුන් වහන්සේගේම වචනවලින් සනාථ වූයේ මෙලෙසිනි. "යමෙක් මා අනුව එන්න කැමැත්තේ ද ඔහු තම කම නසා දිනපතා සිය කුරුසිය දරා ගෙන මා අනුව ආවා වේ" (ලූක් 9:23). එතුමිය ශුද්ධවරයට ඔසවන මෙන් යාච්ඤා කරමින් ඇය කළ කාර්යයන් ඉදිරියට ගෙන යන්නේ, ගෝනවිල හෙලේනා පදනම, හෙලේනා කාන්තා සංගමය සහ ජේසුගේ ශ්‍රී මුහුණ භක්තියේ සාමාජිකයන් ය.

2016 මැයි 19 වන දින, ශුද්ධාසනය විසින් එතුමිය දේව සේවිකා තත්ත්වයට ඔසවන ලදී. ගරු හෙලේනා තුමිය ශුද්ධවරයට එසවීමේ ක්‍රියාවලියට ශුද්ධාසනයේ නිල අවසරය ලැබීමෙන් පසු ඊට අදාළ ශුද්ධාසනීය ක්‍රියාදාමය ඉදිරියට කරගෙන යනු ලැබේ.

පරිශුද්ධ ජීවිතයක් හා උදාරතර ශුද්ධවන්ත ජීවිතයක් ගත කළ ජේසුගේ ශ්‍රී මුහුණ ගෝනවිල ගරු හෙලේනා තුමිය ශුද්ධවරයට ඔසවන මෙන් ඉල්ලා යාච්ඤා කරමු.

**ගරු පැට්‍රික් විජේසිංහ පියතුමා**
**හලාවත පදවිය.**

# තුන් කල් දුටු යතිවරයාණෝ

## (ගරු වික්ටර් සිල්වා පියතුමාගේ ගීතිකා නිර්මාණ පිළිබඳ විමසුමක්)

"සදාතනේ - සදාණනේ

දෝතේ හොවා ගෙන එන්නේ
අප දුක සැප සතුට කඳුළ
කරපින්නා ගෙන එන්නේ
අප වැඩපල සහ ප්‍රතිඵල"

පවනේ මුසුව සවනේ වැකෙන මේ ගීතිකා කොටස අපට පසක් කර දෙන්නේ ගරු වික්ටර් සිල්වා පියතුමාගේ ගී පද රචනයේ හා සත්සර මියැසියේ චමත්කාරය යි. එතුමාගේ ගීතිකා නිර්මාණ සඳහා අවට පරිසර පසුබිම දායක වූ ආකාරය මැනවින් කැපී පෙනෙයි. කැපුන්ගොඩ මීසමේ සහායක පියතුමා ලෙස සේවය කරද්දි නිතර ම අසා පුරුදු මුහුදු රළ බිඳෙන හඬ හා ධීවර ජනයාගේ හද ගැස්ම ද සිය නිර්මාණ දිවියට මඟ පෙන්වී ය.

"ඇතින් ඇසෙනා ඒ ගී රාවේ
සමිඳුනි ඔබෙ පැසසුම් කියැවේ
කඳුවැටි පීරා හමනා සුළඟේ
සමිඳුනි ඔබෙ පැසසුම් කියැවේ

ජය ශ්‍රී වේවා - පැසසුම් වේවා
සමිඳේ ඔබ නිති සැරදේවා"

බසෙහි ඇති සරල බව නිසා ම මෙම ගීතිකාව අප හදවතේ ගැඹුරු තැන් සොයා ඒවා ස්පර්ශ කරවයි. අභියෝගාත්මක තරඟකාරීත්වය ද අප පියතුමාගේ ගීතිකා නිර්මාණ සඳහා මහෝපකාරී විය. අම්පිටිය ජාතික දෙව්සත්හලේ ගොන්සාල්වෙස් සිංහල ආයතනය (ගො. සි. ආ.) මඟින් පැවැත් වූ ගීතිකා නිර්මාණ තරඟයට සිය කුළුඳුල් නිර්මාණය එතුමා ඉදිරිපත් කළේ ය. එම නිර්මාණයට ප්‍රථම ස්ථානය හිමි විය. අප පියතුමාගේ ප්‍රතිභාව ඉන් මනා ව විද්‍යාමාන විය. එම ගීතිකා නිර්මාණය එදින දිව්‍ය පූජාවේ ගායනා කිරීමට තෝරා ගෙන තිබීම ද විශේෂත්වයකි.

"ඉල්ලා යදින දේ - ඔබට දෙනු ලැබේ
සොයන පතන දේ - නොලැබ යනු නැතේ
ඉල්ලන දෙය එකවර බොහෝ විට
දෙනු නොලැබේ
නැවත නැවත පලි ගසා යදිනු පසු නොබා
එවිට එය ලැබේ - ඔබට දෙනු ලැබේ"

'ඉල්ලන්න දෙනු ලැබේ - සොයන්න සම්බ වේ' යන පාඨය කොතරම් අරුත්බර ව මේ පද මාලාවට යොදා ගෙන ඇත් ද? එයට පසු වසරේ පැවැති තරඟයෙන් ද එතුමා සිය නිර්මාණයට ප්‍රථම ස්ථානය දිනා ගත්තේ ය. සිය නිර්මාණ දිවියේ මුල් වකවානුවේ ම මේ ලැබූ ඇගයීම කොතරම් චමත්කාර ජනක ද?

"අපව මවා සැමදා රකින
අවැසිය කොයිකත් ගෙන දෙන
අදර සමිඳු දෙවි පියනම
බැතියෙන් නමදිමු අපි සැම
අපි ඔබ නමදිමු බැතියෙන
තුති දෙමු පසසා ඔබෙ ගුණ

සිංහල කොඩි ගොබ්වැල් මැද
සේසත් හා මුතුකුඩ ගෙන
රට දෙස බස ගුණ වැයුමට
යමු හෙලයිනි දෙව් පුදනට"

කතෝලික ගීතිකාවේ සිංහල ලකුණ සනිටුහන් කිරීමට මෙම නිර්මාණයෙන් එතුමා සමත් වී ඇත. අසීමිත දේව භක්තිය රසබර ව ගීතිකාවේ අන්තර්ගත වී ඇත. දෙව්සත්හලේ අධ්‍යාපනයෙන් පසු මීසම් සේවයට එන නවක පියතුමන්ලාගේ සමාජගත වීම හා හැකියාවන් මුදා හැරීම අගේට ඔපවත් කළ නිර්මාණයකි, 'පොට්ටු පොට්ටු මල් පොහොට්ටු' යන ගීතිකාව. එම නිර්මාණය ගරු ජයලත් බලගල්ල පියතුමා සමඟ එකතු ව අප පියතුමා සහා මාතාවට දායක කර ඇත.

"පොට්ටු පොට්ටු මල් පොහොට්ටු
පෙත්ත පෙත්ත විකසිත වී

මල් ලෝකෙට පිවිසෙනවා
කැදැල්ලේ උන් කුරුලු පැටව්
මව්පිය හැර දෙපත් සලා
අහසට ඉගිලී... යනවෝ... යනවෝ...”

සාන්ත බෙනඩික් නිකාය නියෝජනය කරමින් එවකට ගීතිකා නිර්මාණයේ යෙදුන ගරු පෝල් ප්‍රනාන්දු පියතුමා, ගරු ඕල්මත් ප්‍රනාන්දු පියතුමා වැනි අයගේ මූලිකත්වයෙන් ජාතික දෙව්සත්හලෙහි පිපුණු 'පියුම් පොට්ටු' ගීතිකා පොතට ගරු වික්ටර් සිල්වා පියතුමාගේ නිර්මාණ රැසක් ඇතුළත් කර ඇත. එය අප නිර්මාණකරුගේ සාර්ථකත්වයට දෙස් දෙන්නකි.

ගරු වික්ටර් සිල්වා පියතුමා ශාන්ත ඇලෝසියස් දෙව්සත්හලේ ආචාර්ය මඩුල්ලේ සිටින අවධියේ ඇති වූ මානසික විඩාව මග හරවා ගැනීමට දෙව් මැඳුරට ගොස් භාවනා කළේ ය. එක් දිනක් රාත්‍රියේ මෙසේ භාවනා කරද්දී සත්ප්‍රසාද මණ්ඩපයේ දැල්වුණ පහන් ආලෝකයෙන් එතුමාගේ සිත ආලෝකමත් විය. නව මාවතක් විවර විය. එම ශුද්ධාත්ම පන්නරයෙන් එතුමා නව නිර්මාණයක් බිහි කළේ ය.

“නැත මට සවියක් - නැත මට හිඟයක්
සමිඳුන් මා ළඟ - සිටින තුරා
නැත මට සතුරන් - ඇත මට මිතුරන්
සමිඳුන් මා ළඟ - සිටින තුරා

ගමන් කරන්නට - මඟක් නැතුව මට
දහස් වාරයක් - ලත වී සිටි මම
යා යුතු ඒ මඟ - ක්‍රිස්තුනි ඔබ බව
ඔබ හමු වීමෙන් - අත්දැක්කෙමි මම”

මෙම නිර්මාණය භාවනාවේ ම ප්‍රතිඵලයක් බව එතුමා පවසා ඇත. බයිබල් පාඨ මෙනෙහි කරමින් භාවනාවේ යෙදී, පසුව ගීතිකා නිර්මාණ කිරීම එතුමාගේ පුරුද්දකි. එතුමා අතින් බිහි වූ

“රිසි නම් ඔබ එනු - මා පසු පස සැමදා
ගෙන ඔබ කුරුසිය - ඔබ අමතක කරදා”

එවැන්නකි.

එතුමා දේව මෑණියන්ට දැක්වූ පුදුමාකාර ආදර භක්තිය නිසා ම නමෝ මරි බැතිය සිහිපත් කරමින් නිම කළ

“අම්මේ මා හිස නමා - වඳිමි දෙපද මල් පුදා
ඔබ ගුණේ - සැම දිනේ - පසසමි තුති ගයමිනේ

නමෝ නමෝ මරි - ප්‍රසාදයෙන් පිරි
දෙව් පුත් ඔබ කුස දැරුමට - වාසනා පිරි”

මෙම නිර්මාණය කොතරම් හදවතට සමීප ද යන්න විමසා බැලිය යුතු ම ය.

වර්ෂ 2010 සිට වර්ෂ 2016 දක්වා එතුමා සා. ජෝන් මේරි වියානි දෙව්සත්හලේ පරිපාලක ලෙස සේවය කළේ ය. එහි දී දෙව්සත්හලේ ගායනා කණ්ඩායමට නායකත්වය දී පුහුණු කිරීම ද එතුමා අතින් සිදු විණි. වර්ෂ 2015 දී එතුමා සිය 'සත්සර බැති ගී - දෙවැන්න' නිර්මාණය කළේ ය.

“සුදුසු නොමැත මා සමිඳේ ඔබ කැඳවන්නට
වදනක් එක පවසනු මැන මට හොඳට ම ඇත
දුබල අබල මිනිස් කමින් සිදු වූ වරදට
කමාව දී වඩිනු සමිඳේ මා හද නිවසට”

1948 මාර්තු 18 වන දින මෙලොව එළිය දුටු ගරු ස්ටැන්ලි වික්ටර් සිල්වා පියතුමා දෙස් - විදෙස්හි ශිල්ප හදාරා, දිවයිනේ නම ගිය කිතුනු පාසැල්වල උප අදියුරු, අදියුරු ධූර දරා, එයට අමතර ව මීසම් සේවයේ යෙදී, කීර්තිමත් නාමයක් දිනුවෙකි. මෙවැනි තලෙන්තු සපිරි පියතුමෙකු අප රටට ලබා දීම ගැන අපි දෙවිඳුන්ට තුති පුදමු.

“වික්ටර් සිල්වා පියතුමා දේශීය ගීත පබැඳීම අතින් නිවැරදි තලයක පිහිටා සිටියි. එසේ ම ගීතය නමැති කයට තනුව නැමති ජීවය පිඹ ඇත. ඒවා ප්‍රශංසනීය ය; අරුත්බර ය; හදවතට සමීප ය; රසබර ය” (ගරු බෙනඩික් ජෝශප් පියතුමා)

හරසුන් පහත් අරුමෝසම් නිර්මාණ බහුල ලෙස ලියැවෙන මෙකල පොදු රසඥතාව ඔපවත් කරන දිවැසි කිතුනු ගී නිර්මාණ බිහි කරලීමට ඔබගේ පන්හිඳට තව තවත් ශක්තිය ලැබේවා!

අනිල් ප්‍රසන්න
ශාන්ත පීතර විදුහල, කොළඹ 04.

# THE BEAUTY OF FAMILY LIFE: A SCHOOL OF LOVE, FAITH, AND HOPE

**God's First Gift**

"The well-being of the individual person and of both human and Christian society is closely bound up with the healthy state of conjugal and family life." (Gaudium et Spes, 47) Family is God's first gift to humanity. Before the Church, before the nation, before any institution—there was the family. In the Garden of Eden, God established the first union: "It is not good for man to be alone; I will make a helper suitable for him" (Genesis 2:18). From this sacred beginning, the family was ordained as the cradle of life, the school of love, and the sanctuary of faith.

From the humble home in Nazareth to the bustling streets of Colombo, the family remains the fundamental cell of society. It is here that life begins, love is nurtured, and faith is first whispered. As we navigate the complexities of the modern world—from the echoes of our national struggle for peace to the global challenges of a changing culture—the domestic church stands as a beacon of hope and a sanctuary of life.

**A Divine Plan**

The Second Vatican Council beautifully articulated that the intimate partnership of married life and love is established by the Creator. God Himself is the author of matrimony. This is not merely a human contract, but a sacred covenant rooted in the irrevocable personal consent of the spouses. The Council also declared that "the family is, so to speak, the domestic church." This means that every Christian home is called to be a microcosm of the Church—a place where God is worshipped, where love is practiced, and where faith is passed from one generation to the next.

As the Psalmist sings, "Your wife will be like a fruitful vine within your home; your children like young olive plants around your table" (Psalm 128:3). The family is the first school of love, where we learn the grammar of giving and receiving. Pope Francis, in Amoris Laetitia, reminds us that this joy is not an idealized fantasy but a love "generated by the simplicity and the silent work of life as a couple." He encourages us to see the family as the place where children learn to love, respect, and interact with others.

**For the Young: Roots of Growth**

To the children and youth, you are the "olive plants" around the table. The family is your roots, the foundation upon which you build your future. Your duty to honour your father and mother is a sacred one—not merely a rule but a path to wisdom. The Book of Sirach reminds us, "God sets a father in honour over his children; a mother's authority he confirms over her sons" (Sirach 3:2). By obeying your parents and respecting their guidance, you are storing up riches for your own soul.

The family is the primary place where you learn to navigate the world. Through the witness of your parents, you learn about sacrifice, patience, and the value of hard work. Let the example of the Holy Family—Jesus, Mary, and Joseph—inspire you to be a source of joy and holiness in your own home, "advancing in wisdom and age and in favour before God and man" (Luke 2:52).

**For the Married: The Joy of Love**

To husbands and wives who carry the weight of daily life, the Church looks to you with admiration and support. You are the living stones of the family, the heart of the home. Pope St. John Paul II reminds us that "the future of humanity passes through the family."

The Apostle Paul instructs us: "Wives, be subject to your husbands, as is fitting in the Lord. Husbands, love your wives and never treat them harshly" (Colossians 3:18-19). This is not a call to domination, but to mutual submission in love. It is a call for husbands to love their wives as Christ loved the Church. Love is the fabric of family life. As Scripture teaches, "Above all, clothe yourselves with love, which binds everything together in perfect harmony" (Colossians 3:14). This love is not a fleeting emotion but a daily choice—a decision to serve, to forgive, to be patient, and to persevere through trials.

Today, families face unprecedented challenges—economic pressures, cultural shifts, and the erosion of traditional values. Yet, amid these storms, Christian families are called to be signs of hope.

**For the Elderly: The Crown of the Family**

To the elderly, you are the memory of the family and the nation. Your wisdom, your prayers, and your stories are the pillars that sustain the household. Scripture commands us to care for you with tenderness: "My son, take care of your father when he is old; grieve him not as long as he lives" (Sirach 3:12-13). You are not a burden but a blessing.


Pope Francis has repeatedly called for a "culture of encounter" that includes the elderly, reminding us that "the future of the family depends on the alliance between generations." Without the wisdom of the elderly, the young lose their bearings. Without the energy of the young, the elderly risk isolation. Together, they form the full tapestry of God's family.

**The Domestic Church**

The Second Vatican Council beautifully described the family as the "domestic church." This means that the home is a sacred space where the Gospel is lived and proclaimed. Every meal shared, every prayer prayed, every act of kindness and forgiveness—these are the liturgy of domestic life. Parents are the first catechists of their children, and their example speaks louder than any sermon. As Joshua declared: "As for me and my house, we will serve the Lord" (Joshua 24:15).

**Fr. Chamika Sudarshana OMI**
**St. Vincent's Home, Maggona**

# මේ අහන්න...



බෙත්ලෙහෙමේ ගව හලකින් උතුම් පවුල බිහි වුණේ
සරල චාම් ගති පැවතුම් ඒ පවුලෙන් මතු වුණේ
කීකරුකම, අවනත බව දැහැමි කමට මුල් වුණේ
සුදු පවුලක් ලෙසින් ලොවට ආදර්ශය සැපවුණේ

පවුල තරම් උත්තම වන තවත් තැනක් නැත ලොවේ
දරුවන් හදනා - තනනා තෝතැන්න යි පෙරමුණේ
මව් - පිය සෙනෙහස ලබමින් යහගුණයෙන් සපිරුණේ
විශ්වය ජය ගනු ලබන්න අකුරු කරන තැන අපේ

ආදරයයි - කරුණාවයි ප්‍රේමය සමඟින් පිරේ
එවන් පවුල් වාසනාව උපතින් කද බැඳ එතේ
සියල් සපිරි සතුට දරා අත්වැල් බැඳ යනු පෙනේ
මහිමාලංකාරය හිමි එවන් පවුල් බැබළෙතේ

කොයි දේටත් පවුල් බලය තද විලසින් දැනෙණුයේ
එක්සිත්ව සිටින විට දී සමඟිය තහවුරු කෙරේ
අසමඟියක් පැන නැගුණත් විගහට එය විසඳෙති
තරහ මරහ ඇති වන්නට කිසි විටකත් ඉඩ නැතේ

පවුල් අවුල් බලපාන්නේ සැකය මතු වුණොත් හිතේ
විනාශයේ ආරම්භය එතැනින් පසු හට ගැනේ
විශ්වාසය නැති අය තුළ ප්‍රශ්න තමයි හැම වෙලේ
අවංක හදවත් ඇත්තෝ හැම විටකම ප්‍රීති වේ

නිවැරදි මග යන පවුලට කොයි කවුරුත් කැමති වේ
උණුසුම් අයුරින් ඒ අය නිතර නිතර පිළි ගැනේ
පවුල එකට ඉන්නා විට හොඳ නම නිති හිමි වෙතේ
එකට සිටින පවුල් වලට දෙවිඳුන් ආසිරි ලැබේ

රූපස් ප්‍රැන්සිස්

# මෙන්න තවත් ත්‍යාගයක්...

'භක්ති ප්‍රබෝධනය' කලාපයේ සඳහන් වන එක් තේමාවක් ඔස්සේ ඔබගේ අදහස් අපට ලියන්නට ආරාධනා කරමු. මෙවර **"පවුලේ මහිමාලංකාරය" තේමාව යටතේ පළ කර ඇති ගීතය, 'හෙළිදරව්ව' ලිපිය හෝ කෙටි කතාව පිළිබඳ** ඔබගේ අදහස ලියා **"'භක්ති ප්‍රබෝධනය', අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10"** ලිපිනයට තැපැල් කරන්න.

තමන් තේරුම් ගත් ආකාරයට තමන්ගේ වචනවලින් ලියන්න. වචන 300ට වඩා වැඩි නො විය යුතු ය. තමන්ගේ ම අත් අකුරින් ලියා එවන්න. **පාසල්, විශ්වවිද්‍යාල මට්ටමේ හෝ උසස් අධ්‍යාපන කටයුතුවල නිරත වන ඕනෑ ම ශිෂ්‍ය ශිෂ්‍යාවකට හෝ විද්‍යාර්ථියකුට** මේ සඳහා ලිපි ඉදිරිපත් කළ හැකි ය. ප්‍රශස්ත මට්ටමේ ලිපි ඉදිරිපත් කරන තිදෙනකුට වටිනා පොත් තුනක් ත්‍යාග වශයෙන් පිරිනැමේ.

**පසුගිය කලාපයේ ඉදිරිපත් කළ මෙම තරගයට සහභාගි වූ අතරින් ජයග්‍රහණය කරනුයේ නීතිවේදී ශෙලින්ඩා සමරසිංහ මෙනවිය යි. ඔබට හිමි ත්‍යාග පොත යථා කාලයේ දී ලැබෙයි.**

# දන්නවද අපිත් දවසක...

සිංහල දෙමළ මුස්ලිම් බර්ගර් ද සැම
එක සෙවනක එක අම්මගෙ දරුවො ලෙස
දැක ගැනීම වරදක් ලෙස සිතන දනා
බහුතරයක් සිටිනව මේ දෙරණ මත

මං පමණයි මං විතරයි සිතන සැම
බහුතරයේ සිංහල ලේ කියන දනා
එක පවුලක් අපි සැම දෙනා කියන දිනා
ඒවා උදා මගෙ මේ ලක් දෙරණ මත

වෙන්වී වැනසෙමු එක්වී සැනසෙමුද
රටේ අනාගතේ දරුවන් ගේ නොවෙද
කළු ජූලිය යුද්ධෙ උතුරෙ අමතකද
ආපහු අපි ඒ තැනටම යා යුතුද

තුන්සිය හැටපස් දවසින් එක දිනක
එක දවසක එක වරුවක සාලෙ මැද
කවදාහරි ඉන්නව මළ මිනිය ලෙස
දන්නවා ද අපි දවසක මැරෙන බව



චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම ........



# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



### ''පැයක් මට දෙන්න අම්මේ, තාත්තේ''

මිනුලිට වයස අවුරුදු දොළහයි. ඇය දැන් හත වසරේ. නගරයේ බාලිකා පාසලක ඉගෙනගන්නෙ. මිනුලිගෙ අම්මයි, තාත්තයි දෙන්නම අගනුවර රැකියාවන් කරන අය. ඒ නිසා දෙදෙනාම පාන්දරින් ගෙදරින් ගිහින් රෑ වෙලා තමයි ගෙදර එන්නේ. මිනුලිව බලාගන්නෙ ලොකු අම්මයි, ලොකු තාත්තයි. අම්මයි, තාත්තයි ගෙදර ආවත් රෑ නින්දට යනකල්ම වැඩ... වැඩ... වැඩ... වැඩ... ඒ දෙන්නා කොයිවෙලේ නිදාගන්න ඇඳට එනවද කියලවත් මිනුලි දන්නේ නෑ.

මිනුලිට ගොඩක් තනිකම දැනුණත් කරන්න දෙයක් නෑ. එයාට අම්මයි, තාත්තයි එක්ක ඒ ගැන කතා කරන්න එයාට දැනුමක් තිබුණෙත් නෑ.

ඔන්න දවසක් ඉස්කෝලෙදි උපදේශන සේවා ගුරුතුමිය හත වසරේ දරුවන්ට චිත්‍රයක් අඳින්න දුන්නා. දරුවන්ගේ මානසික සුවතාව ගැන කරන පර්යේෂණයක වැඩක් විදියට තමයි ඇය ඒ චිත්‍රය අඳින්න දරුවන් යොමු කළේ. මාතෘකාව තමයි,

"පවුලේ හැමෝම සතුටින් එකට ඉන්න පින්තූරයක්..."

එකට කෑම කන, චාරිකා යන, උපන්දින සාද පවත්වන, ළඟින් වාඩි වෙලා කතා බහ කරන මේ වගේ එක එක අවස්ථා දරුවො ඇඳල තිබුණා. මේ අතර වෙනස් චිත්‍ර කිහිපයක් තිබුණා. ඉන් එකක් මිනුලිගේ චිත්‍රය. ඒ චිත්‍රයේ අම්මාත් උන්නා, තාත්තාත් උන්නා. මිනුලිත් උන්නා. පුංචි සතුටකුත් අම්මයි, තාත්තා ළඟ පේන්න තිබුණා. මිනුලි නම් උන්නෙ දුකින්. තුන් දෙනා උන්නෙ තුන් තැනක. තාත්තා එයාගෙ වැඩ කරන මේසයෙ. අම්මා කුස්සියෙ. මිනුලි එයාගෙ සෙල්ලම් බෝනික්කා එක්ක.

ඔන්න උපදේශන ගුරුතුමිය මිනුලි එක්ක ටිකක් කතා කළා. මිනුලිට දැනුණා තමන්ගෙ තනිකම ගැන කතා කරන්න මේක හොඳ අවස්ථාවක් කියල. මොකද මීට කලින් කවුරුවත් ඒ ගැන අහල නෑ. ඇය කාටවත් කියලත් නෑ. උපදේශන ගුරුතුමිය බොහොම කරුණාවෙන් චිත්‍රය ගැන විස්තර අහද්දි මිනුලි එයාට දැනෙන දේ ගුරුතුමිය එක්ක කතා කළා.

අම්මයි, තාත්තයි නිතරම ගෙදර නැති බව, ලොකු අම්මා හැමවෙලේම වැඩි පරිස්සමට කිසිම දෙයක් කරන්න නොදෙන එක, නිතරම ගේ ඇතුළටම වී ඉන්න සිදුවෙන එක, කතා කරන්නවත් කෙනෙක් නැති එක, මිනුලි හිතේ සඟවන් උන්නු හැමදේම කියන්න ගත්තා.

'එපා' 'එපා' 'එපා' තමයි හැමවෙලේම. මට මිදුලෙ සෙල්ලම් කරන්න දෙන්නෙත් නෑ. මං ආස නෑ ටීච ලොකු අම්මා එක්ක හැමවෙලේම ඉන්න. ලොකු තාත්තා නම් කිසිදෙයක් එපා කියන්නෙ නෑ. ඒත් එයා අසනීපෙන් ඉන්න නිසා මා එක්ක කතා කරන්නවත් කැමති නෑ..."

ගුරුතුමිය සාවධානව ඇහුම්කන් දුන්නා. තමන්ගේ ප්‍රශ්නයක්, වේදනාවක් ආදරණීය වැඩිහිටියකු එක්ක බෙදාගැනීම කොයිතරම් හොඳද කියන එක මිනුලි තේරුම් ගත්තා.

"හොඳයි පුතේ, දැන් මේ චිත්‍රය වෙනස් කරලා අඳින්න නම් මොකද වෙන්න ඕන... ඔයා කැමති කොහොමද?"

"ටීච... රෑට ගෙදර ආවම පොඩි වෙලාවක් හරි මං ළඟින් ඉන්නවනම්, මං ඉස්කෝලෙ වැඩ කරද්දි, මං නිදාගන්න යද්දි පොඩි වෙලාවකට හරි ඒ දෙන්නත් ළඟින් ඉන්නවනම්, එහෙම චිත්‍රයක් අඳින්න මං ආසයි..."

මිනුලි කිව්වා. "අපට ඉක්මණින්ම ඒ චිත්‍රය අඳින්න පුළුවන් දුව..." ටීච ආදරෙන් මිනුලිව තුරුළු කරගත්තා.

තරු නැන්දා

# ප්‍රහේලිකා අංක - 93

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | | 3 | | 4 | 5 | ■ | 6 | |
| 7 | | ■ | | ■ | 8 | | ■ | | ■ |
| ■ | | ■ | | ■ | | ■ | 9 | | 10 |
| 11 | | 12 | | ■ | 13 | 14 | ■ | 15 | |
| ■ | ■ | | ■ | 16 | | | | ■ | ■ |
| 17 | | | 18 | ■ | | ■ | ■ | 19 | 20 |
| | ■ | 21 | | | ■ | 22 | | | |
| 23 | | | | ■ | 24 | | ■ | ■ | |
| | ■ | ■ | ■ | 25 | | | ■ | 26 | |
| 27 | | | ■ | 28 | | ■ | 29 | | |

**පහළට**

1. ඉශ්‍රායෙල් උතුරු රාජ්‍යයේ 10 වන රජතුමා
2. සාන්තුවරු සිහි කිරීම සඳහා නිර්මාණය කෙරේ.
3. හිස් අවකාශය
4. හම්බන්තොට ප්‍රදේශයේ පිහිටි ග්‍රාමීය ප්‍රදේශයකි.
5. පට පණුවා තනන කෙඳි වලින් වියන ලද රෙදි
6. පවුලක මුල් පුද්ගලයන් දෙදෙනා
10. නැවත දීමට ලබා ගන්නා මුදල
12. මගධ රාජ්‍යයේ හුන් අජාසත්ත කුමරුගේ පියා
14. දෙවියන් උදෙසා පුදන පූජා
17. පවුල් ජීවිතයක තිබිය යුතු අත්‍යවශ්‍ය ගුණාංගයකි.
18. "කාර්යය" යන්නට සමාන වචනයකි.
19. කැදරකම, ආශාව
20. පවුල
22. නිශාචර පක්ෂියෙකි.
24. සමාජයේ මූලිකම හා කුඩාම ඒකකය
25. කුඹුරුවල ඉතා සුලබව දැකිය හැකි පක්ෂියෙකි.
26. ඇසීමට උපකාර වන ශරීර අවයවය.

**හරහට**

1. ශු. පවුලේ ත්‍රිවිධ පුද්ගලයන්
6. විටමින් C සහ A සහිත පළතුරකි.
7. පුරුදු, පළපුරුදු යන අර්ථයට සමාන ය.
8. "ලැබුණු" යන්නට සමාන අරුත් දේ.
9. ඒ මොහොතේ
11. වැටවල් ගැසීමට අත්‍යවශ්‍ය ය.
13. පවුලේ මූලිකයා
15. විවාහක කාන්තාවක් ඇමතීමට යොදා ගනී.
16. අනුරාධපුරයට හා මරදන්කඩවලට නුදුරින් පිහිටි ඓතිහාසික හා පාරිසරික වටිනාකමකින් යුත් කන්දකි.
17. මව, ස්ත්‍රිය, අඹුව, භාර්යාව යන වචන සියල්ලටම සමාන අරුත් දේ.
19. විශාල
21. කාන්තා ඇඳුමකි.
22. දම් පැහැ එළවළුවකි.
23. වාටියක, රෙද්දක රටා, මෝස්තරවලින් අලංකාර වූ ................ කෙලවර කොටස.
24. දේව ආදරයට විරුද්ධව අප කරන දේ
25. අලුත් අවුරුදු කාලයේ දැකිය හැකි පක්ෂියා
26. ඇසෙන් ගලන ශ්‍රාවයකි.
27. අපගේ වැඩ පහසු කර ගැනීම සඳහා යොදා ගැනේ.
28. හතරෙන් පංගුව
29. ජන සනත්වයෙන් ලෝකයේ දෙවැනි තැන ගන්නා රට

**ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා,**
සාන්ත වින්සෙන්ති නිවාසය, මග්ගොන.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2026 ඔක්තෝබර් 15** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 93**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 91 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 හෝ | ර් | 2 මු | ස් | | 3 ජෙ | රු | 4 ස | ල | 5 ම |
| මෝ | | ග | | | ස් | | මි | | රි |
| 6 න | 7 හු | ල | | 8 ජු | සේ | 9 තු | මා | | යා |
| | 10 ල | න් | 11 ද | | | 12 සි | න | මා | |
| 13 ආ | | | 14 ර | 15 වි | | ත | | | 16 කා |
| 17 යු | වා | න් | | 18 ජා | 19 න | | 20 මු | තු | ර් |
| ෂ | | | 21 පා | ති | මා | | | | මෙ |
| | 22 වෙ | 23 ඩි | | 24 ක | මි | | 25 බෙ | තෙ | ල් |
| 26 ටෙ | හෙ | රා | න් | | | 27 බ | ර | | මැ |
| | 28 ස | මි | | 29 ලූ | ර් | දු | | 30 රා | ණි |

**ආදරණීය දරුවනි,**

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.


**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com


## ප්‍රහේලිකා අංක 91 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 91 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - S. D. S. H. ෆ්ලවියානා සිල්වා, 8 ශ්‍රේණිය, ශුද්ධ වූ පවුලේ බාලිකා මහා විද්‍යාලය, වෙන්නප්පුව.
- **දෙවන ස්ථානය** - P. A. අනුත්තරා, ලොයොලා විදුහල, බෝපිටිය.
- **තෙවන ස්ථානය** - සෙනෙත්මා ඉරුදිනි ප්‍රනාන්දු, 7 ශ්‍රේණිය, අනුරුද්ධ මහා විද්‍යාලය, ලුණුවිල.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2026 නොවැම්බර් / දෙසැම්බර් - "එනවා යනවා"**
(නොවැම්බර් / දෙසැම්බර් කලාපය සඳහා ඔබ එවන ලිපි සැප්තැම්බර් 15ට පෙර අප වෙත එවන්න.)

**2027 ජනවාරි / පෙබරවාරි - "කාලය"**
(2027 ජනවාරි / පෙබරවාරි කලාපය සඳහා ඔබ එවන ලිපි නොවැම්බර් 15ට පෙර අප වෙත එවන්න.)

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

# පලස්තීනයේ භූගෝලීය පසුබිම II

පසුගිය කලාපයේ පලස්තීනයේ සිතියමක් ඔබ වෙත ඉදිරිපත් කර ඇත. පලස්තීන දේශයේ කලාප 4කි. එම කලාප 4 පහත සඳහන් පරිදි වේ.

1. වෙරළබඩ තීරුව

මෙය මුහුදු තීරය, මධ්‍යධරණී වෙරළ තීරය ලෙස ද හැඳින්වේ. දකුණේ පිහිටි ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියාවෙන් ආරම්භ වී වාඩි එල් අරිස් දක්වා මෙම තීරය ව්‍යාප්ත වේ. හීසොන්, ජාකොන් යන අතු ගංගා ද වෙරළ තීරය ඔස්සේ මුහුදට ගලා බසී. වෙරළ තීරයේ ප්‍රධාන මිටියාවත් 3කි. එනම්,

1. අක්කෝ තැනිතලාව
2. ෂාරොන් තැනිතලාව
3. පිලිස්ති තැනිතලාව

එමෙන්ම තවත් කුඩා තැනිතලා දෙකකි. එය,

1. එස්ත්‍රලෝන් තැන්න සහ
2. බටහිර නේගෙබ් වශයෙනි.

ප්‍රධාන මාර්ගයක් වන මුහුදු මාර්ගය හෙවත් වෙළඳ මාර්ගය වැටී ඇත්තේ ද මෙම තැනිතලාව ඔස්සේ ය.

### අක්කෝ තැනිතලාව

කාර්මේල් කඳු පාමුල සිට උතුරට තීර් දක්වා විහිදේ. එවකට ප්‍රසිද්ධ වරාය නගර ප්‍රදේශයකි. ඉතාමත් සාරවත්ව බෝග නිෂ්පාදනය වන ජනාකීර්ණ ප්‍රදේශයකි. මකබි කැරලි (මකබිවරුන් හා ග්‍රීක්වරුන් අතර) ඇති වූ ප්‍රදේශයකි (1 මකබි 5:14-15). එමෙන්ම එලියා දිවැසිවරයා සහ බාල් දෙවියන් අදහන පූජකවරුන් අතර සටනක් ද කාර්මේල් කඳු ගැටය අසළ සිදු වී ඇත (1 රාජාවලිය 18).

### ෂාරොන් තැනිතලාව

ජොප්පාවේ සිට කයිසාරිය දක්වා මෙම තැනිතලාව විහිදේ. වෙරළ තීරයේ කේන්ද්‍රිය ප්‍රදේශය ද මෙය වේ. එමෙන්ම වගුරු බිම් සහිත ප්‍රදේශයකි. ශුද්ධ වූ පේදුරු තුමා විවිධ සතුන් සහිත රුවල පිළිබඳ දර්ශනය දුටුවේ ද මෙම ස්ථානයේ දී ය. නූතනයේ නවීන නගරයක් වන ටෙල්-අවිව් නගරය පිහිටා ඇත්තේ ද මෙම ප්‍රදේශයෙහි ය. ශුද්ධවූ පාවුලු තුමන්ව ක්‍රි.ව. 58 - 60 අතර කාලයෙහි මෙම තැනිතලාවේ කයිසාරිය නගරයේ සිරගත කර ඇත.

### පිලිස්ති මිටියාවත

ජොප්පාවේ සිට දකුණට ගාසා තීරය දක්වා විහිදේ. මිසරයේ වහල්ව සිටි දේව ජනතාව නිදහස ලබා ගැනීමෙන් පසුව සාවුල්, දාවිත් හා සලමොන් යන රජවරුන් යටතේ පිලිස්තිවරුන් සමඟ සටන් කර මෙම ප්‍රදේශය දිනාගෙන ඇත. අසුදෝසු, අෂ්කෙලෝන්, ගාසා යන ප්‍රධාන නගර පිහිටා ඇත්තේ ද පිලිස්ති මිටියාවතේ ය. ඔලිව් හා ධාන්‍ය වර්ග මෙම ප්‍රදේශයේ සරුවට වැඩේ.

### එස්ත්‍රලෝන් තැන්න

මෙම තැනිතලාව මුහුදු තීරයට මෙන්ම බටහිර කඳුවැටිය ද අයත් වේ. මෙම තැනිතලාවට මිහිදෝ තැන්න, ඉශ්රියල් තැන්න ලෙස ද නම් කරයි. ගලීලයේ වෙන් කර ඉහළ ගලීලය සහ පහළ ගලීලය ලෙස වෙන් වීමට හේතුව මෙම එස්ත්‍රලෝන් තැනිතලාවයි. මෙම ප්‍රදේශය ත්‍රිකෝණාකාර ය. කාර්මෙල් කන්ද, තාබෝර් කන්ද, ආබෙල් කන්ද යන කඳු මායිම් වූ ත්‍රිකෝණාකාර තැනිතලාවකි. කෘෂිකාර්මික කටයුතු සඳහා සාරවත් ප්‍රදේශයකි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයේ ද එස්ත්‍රලෝන් තැනිතලාව හා සම්බන්ධ අවස්ථා ඇත.

උදා - නායින් නුවර වැන්දඹුවගේ පුතා උත්ථාන කිරීම (ලූක් 7:11-17).

### බටහිර නේගෙබ්

නෙගෙබ් යන්න අර්ථ දැක්විය හැක්කේ "වියළි" යන අදහස යි. එහෙත් ශුද්ධ ලියවිල්ල පෙන්වා දෙන්නේ "දකුණ" යන අර්ථය යි. ශුද්ධ ලියවිල්ලේ පෙන්වා දෙන ඊශ්මායිල් සහ හාගර් යන දෙදෙනා ජීවත් වූ නගරය එනම් බෙයර්ෂෙබා පිහිටා ඇත්තේ ද නේගෙබ් ප්‍රදේශයේ ය. බෙයර්ෂෙබා නගරය වැදගත් වීමට තවත් හේතුවක් වන්නේ ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේ සමග ඇති කරගත් ගිවිසුම

ඊසාක් සමඟ අළුත් කරන ලද්දේ බෙයර්ෂෙබා නගරයේ ජීවත් ව සිට ඇත.

2. <u>බටහිර කඳුවැටිය</u>

මුහුදු තීරය සහ ජෝර්දාන් මිටියාවත අතර පිහිටා ඇති කඳුකර ප්‍රදේශය බටහිර කඳුවැටිය වේ. මෙම කඳුවැටිය මැදින් එස්ත්‍රලෝන් තැනිතලාව විහිදී ඇති බැවින් ඉහළ ගලීලය සහ පහළ ගලීලය කොටස ලෙස කඳුවැටිය දෙකඩ වේ. මිසරය සහ සිරියාව හරහා ගමන් කරන වෙරළ මාර්ගය හෙවත් මුහුදු තීරය මෙම එස්ත්‍රලෝන් තැනිතලාව හරහා වැටී ඇත. ක්‍රි.පූ. 609 දී මිසරයේ රජ වූ පාරාවෝ නෙකෝ රජතුමා ජොෂියා රජතුමාව ඝාතනය කරනු ලැබුවේ ද මෙම ප්‍රදේශයේ දී ය. බටහිර කඳුවැටිය භූගෝලීය වශයෙන් කොටස් 3 බෙදේ.

1. ගලීල කඳුවැටිය
2. සමාරිය කඳුවැටිය
3. ජුදා කඳුවැටිය

එමෙන්ම නේහෙබ් හි කොටසක් ද භූගෝලීය වශයෙන් බටහිර කඳුවැටියට අයත් වේ.

**ගලීලය කඳුවැටිය**

ලෙබනන් කඳු පන්තිය ඔබ්බෙන් පිහිටි සිරියාව උතුරු සීමාව වේ. දකුණු සීමාව වන්නේ සමාරිය ප්‍රදේශ මායිම යි. ක්‍රිස්තුන් වහන්සේ ඇති දැඩි වූ ගම්මානය නාසරෙත් පිහිටා ඇත්තේ මෙම ප්‍රදේශයේ ය. (ලූක් 4:16) ජේසුස් වහන්සේගේ පළමු ප්‍රාතිහාර්යය සිදු කළ කානා නගරය මෙම ප්‍රදේශ ආශ්‍රිතව පිහිටා ඇත.

**සමාරිය කඳුවැටිය**

සමාරිය ප්‍රසිද්ධත්වයට පත්වන්නේ ක්‍රි.පූ. 722 අසිරියානු ආක්‍රමණයක් සමඟ ය. ක්‍රි.පූ. 922 දී පලස්තීනය දෙකඩ වූයේ රාජ්‍යයන් 2 ලෙස ය. ඉන් උතුරු රාජ්‍යයට ෂෙකෙම් ලෙසත් පසුව සමාරියාව ලෙසත් නම් කෙරුණි. (2 රාජාවලිය 17:24) සමාරියේ හෙරසීම් කන්ද පිහිටා ඇත. බහු දේව වන්දනාවට ප්‍රසිද්ධියක් ඉසුළු බැවින් ඒක දේවවාදී ජුදාවරු සමරිතානුවරුන්ව ප්‍රතික්ෂේප කළේ ය. බෙතෙල්, ෂිලෝ, ෂෙකෙම් වැනි බාල් දෙවිවරුන්ට වෙන් කරන ලද ස්ථාන සමාරියෙහි විය. ආදිපිය වූ ජාකොබ්ගේ පුත් ජෝසප් ඉශ්මායිල්වරුන්ට විකුණන ලද දෝතාම් ස්ථානය පිහිටා ඇත්තේ ද සමාරියේ ය. ක්‍රිස්තුන් වහන්සේ සමාරියන්ව ප්‍රතික්ෂේප කළේ නැත. ඔවුන්ට කරුණාව දැක්වීය.

**ජුදා කඳුවැටිය**

පලස්තීනයේ තෙවන විශාල භූමි ප්‍රදේශය මෙම කඳුවැටිය යි. උතුරු මායිම වන්නේ සමාරියා ප්‍රදේශය යි. දකුණු මායිම වන්නේ බෙයර්ෂෙබා නගර සීමාව යි. ජුදාවරුන්ගේ ආගමික මධ්‍යස්ථානය වන ජෙරුසලම් දේව මාලිගාව සහ ඔවුන්ගේ සමාජීය මධ්‍යස්ථානය වන ජෙරුසලම් නගරය පිහිටා ඇත්තේ ජුදා කඳු වැටියේ ය. ප්‍රදේශයේ උසම නගරය වන්නේ හේබ්‍රොන් නගරයයි. හේබ්‍රොන් නගරයේ දී දාවිත් රජතුමාව අභිෂේක කර ඇත. ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිදු වූ බෙත්ලෙහෙම පිහිටා ඇත්තේ ද එම ප්‍රදේශයේ ය. ඔලිව් කන්ද, කිද්‍රොන් ඇල, ගෙහෙන්නා නිම්නය වැනි බොහෝ වැදගත් ස්ථාන පිහිටා ඇත. ලාසරස්, මාර්තා සහ මරියාගේ නිවස පිහිටා තිබූ බෙතානිය ද එම කඳුවැටියේ පිහිටා ඇත.

3. <u>ජෝර්දාන් මිටියාවත</u>

බටහිර කඳුවැටිය සහ නැගෙනහිර කඳුකරය අතර පහත්බිම් ප්‍රදේශය හරහා ජෝර්දාන් ගඟ ගලා හැලේ. ඒ අවට භූගෝලීය ප්‍රදේශය ජෝර්දාන් මිටියාවත යි. මුහුදු මට්ටමේ සිට අඩි 675 ක් පමණ පහළින් මෙම ප්‍රදේශය පිහිටා ඇත. ජෝර්දාන් නිම්නය ආරම්භ වන්නේ උතුරින් දාන් ප්‍රදේශයේ ලෙබනන් කඳු පන්තිය අතරිනි. ඉන් පසුව ගඟ ගලා පැමිණ ගලීල මුහුදට ජලය එක් වේ. ගලීල මුහුදට භාවිත වන වෙනත් නම් කිහිපයකි. කින්නරෙත් විල (ජොෂුවා 12:3), තිබේරියස් විල (ජොහාන් 6:1), ජෙනසෙරත් විල (ලූක් 5:1). ගලීල මුහුද අවට පිහිටි ප්‍රධාන නගර වනුයේ කපර්නාවුම, බෙත්සයිදාව, මද්ගලාව, තිබේරියස් යන නගර වේ. ජෝර්දාන් මිටියාවතේ අනෙක් කොටස වන්නේ මළ මුහුද යි. මළ මුහුදට භාවිත වෙන වෙනත් නම් අරබා මුහුද, ලුණු මුහුද. මෙම මුහුදට මළ මුහුද ලෙස වහරන්නේ කිසිම ජීවියෙකු එම මුහුදේ ජීවත් නොවන බැවිනි.

4. <u>නැගෙනහිර කඳුවැටිය</u>

පලස්තීනයේ නැගෙනහිර ප්‍රදේශයේ ජෝර්දාන් මිටියාවතට ඇතින් පිහිටා ඇත. බෂාන්, ගිලියද්, අම්මෝන්, මෝවබ් වැනි ප්‍රදේශ ප්‍රධාන නගර වේ. මෙම මිටියාවත හරහා යාර්මුක්, ජබොක්, ආර්නොන්, සෙරද් යන ගංගා ගලා පැමිණ ජෝර්දාන් ගඟට එක් වේ.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

# කතෝලික ධර්මය

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II වන කොටස

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2026

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. 1. ඉතාලියේ ලන්චියානෝ නුවර දිව්‍ය සත්ප්‍රසාදීය ප්‍රාතිහාර්යය සිදු වූ දේවස්ථානය කැපකර ඇති මුනිතුමා කවුද?
    2. 1978 දී නාසා ආයතනය ටියුරින් නුවර පැවැත්වූ පර්යේෂණය කුමක් ද?
    3. ජුදෙව්වන් වසරක් පාසා උත්සවාකාරයෙන් පැවැත්වූ මංගල්‍යය කුමක් ද?
    4. පැරණි ගිවිසුමේ ජුදා ජනතාව පාස්කු මංගල්‍යය ලෙස පැවැත්වූයේ කුමක් ද?
    5. ශුද්ධ වූ ජුවාම් තුමාට අනුව දිව්‍ය පූජාවේ යථාර්ථය කුමක් ද?
    6. ඉශ්‍රායෙල් පුදපූජාවල ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
    7. බටහිර ජර්මනියේ බර්ලින් තාප්පය බිඳ දමා රට එක්සත් කිරීමට මූලික වූයේ කවුද?
    8. ශුද්ධ වූ මැක්සිමිලියම් කෝල්බේ මුනිතුමාගේ ආදර්ශ පාඨය කුමක් ද?
    9. ප්‍රසාද ස්නාපනයේ දී භාවිත කරන සංකේතාත්මක ද්‍රව්‍ය අතරින් ප්‍රසාද ස්නාපනයේ දී ප්‍රධාන හා අනිවාර්ය සංකේතය කුමක්ද?
    10. සමාව දානය කිරීමේ දේව ප්‍රසාද නිධානයේ ප්‍රධාන ප්‍රතිඵලය කුමක්ද?

02. 1. සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
    2. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හඳුන්වන වෙනත් නම් 3ක් ලියන්න.
    3. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගන්නා පුද්ගලයා අනුගමනය කළ යුතු පියවර 5ක් නම් කරන්න.

03. 1. පදවි පූජක පොරොන්දු දෙක ලියන්න.
    2. පූජාප්‍රසාදිවරයෙකුගේ වගකීම් 3ක් ලියන්න.
    3. පූජාප්‍රසාදීන් වහන්සේලා වෙනුවෙන් ගිහියන්ගේ යුතුකම් 5ක් ලියන්න.

04. 1. කිතුනු විවාහයේ ලක්ෂණ 2 ලියන්න.
    2. විවාහ පොරොන්දුවේ ඇති ප්‍රධාන කරුණු 3ක් ලියන්න.
    3. කිතුනු විවාහයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 5ක් ලියන්න.

05. 1. තාපස පැවිදි ජීවිතයට විනය මාලාවක් සකස් කළ පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.
    2. පැවිදි වේදහාර තුන නම් කරන්න.
    3. පැවිදි සොහොයුරියන්ගේ නිකායන් 5ක් නම් කර ඒවායෙන් සිදුවෙන සේවාවක් බැගින් ලියන්න.

## පිළිතුරු

**01.** 1. ශුද්ධවූ ලෙගොන්ෂියන් මුනිතුමා 2. ශ්‍රී සළුව පිළිබඳ පර්යේෂණය 3. පාස්කු මංගල්‍යය
4. දෙවියන් වහන්සේ විසින් ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල් බවින් මුදා ගැනීම.
5. ප්‍රේමය හා සේවය ක්‍රියාවට නැංවීම යි. 6. දවන පූජා / නොදවන පූජා.
7. ශුද්ධවූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
8. "යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත" යනු යි.
9. ජලය 10. පව් සමාව යි.

**02.** 1. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය / රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය
2. සිත් හැරීමේ දේව ප්‍රසාද නිධානය / පශ්චත්තාපයේ දේව ප්‍රසාද නිධානය / පාපොච්චාරණය / සමාව දානය කිරීමේ දේව ප්‍රසාද නිධානය.
3. ආත්ම සෝදිසියක යෙදීම / කළ පාපවලට මනස්ථාපනය වීම / නැවත එම පව් නොකිරීමට සිතා ගැනීම / සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීම / දෙන දඬුවම් හා පශ්චත්තාපික ක්‍රියා ඉටු කිරීම.

**03.** 1. කීකරුකම / පූජක බඹසර.
2. සුබාරංචිය දේශනා කිරීම / ජනතාවට සැබෑ එඬේරෙකු වීම / දේව වන්දනා මෙහෙයන් පැවැත්වීම / තම පදවියේ රදගුරු තුමන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම / දේව ජනතාවගේ අධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීම.
3. ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම හා ඔවුන්ට ගරු කිරීම / ධර්මෝපදේශ සේවාවන්ට සම්බන්ධ වීම / මීසමේ සේවාවන්ට දායක වීම / දේවවන්දනා කටයුතු වලට සහාය වීම / දේව රාජ්‍ය පතල කිරීමේ කාර්යයට දායක වීම.

**04.** 1. ඒකත්වය / අඛණ්ඩත්වය
2. වාසනාවත් කල්හි ද අවාසනාවත් කල්හි ද එකට සිටීම / ලෙඩ දුකේ දී හා සුව සැපේ දී විශ්වාසවන්ත වීම / මුළු ජීවිත කාලය තුළ දී ම ප්‍රේම කිරීම හා ගෞරව කිරීම.
3. විවාහවන යුවළ ජීවිතාන්තය දක්වා තම සම්බන්ධතාවය පවත්වාගෙන යාම / තම පවුලට ලැබෙන දරුවන් සතුටින් භාර ගැනීම / විවාහ වන යුවළ ගොඩ නඟා ගන්නා ආදරය දිනෙන් දින වර්ධනය කර ගනිමින් ජීවත් වීම / ක්‍රිස්තියානි හැදියාව ඇතිව දරුවන් ඇති දැඩි කිරීම හා අධ්‍යාපනය දීම.

**05.** 1. ශු. බෙනඩික් තුමා හා ශු. ජකෝමියස් තුමා.
2. ව්‍රතශුද්ධිය / කීකරුකම / දිළිඳුකම.
3. සුරදූත පැවිදි නිකාය - පාසල් සේවා / ළමා නිවාස පවත්වා ගැනීම, ශු. පවුලේ නිකාය - අධ්‍යාපන සේවය / ධර්මෝපදේශ සේවය, සිරිකුරුස නිකාය - සෞඛ්‍ය සේවය / වතු සේවය / සමාජ සේවය, දයාවේ සහෝදරියන්ගේ නිකාය - අධ්‍යාපනය / මහලු නිවාස පවත්වා ගැනීම, යහපත් එඬේරාගේ පැවිදි නිකාය - අසරණ අයට පිහිටවීම / තරුණ තරුණියන්ට මඟ පෙන්වීම

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මීනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

Sea Master

*Handled Locally Recognised Globally*

## OUR SERVICE :

- Shipping Agency
- NVOCC Service
- Total Logistics
- Container Storage & Handling
- ISO Tank Service
- Project Cargo & Heavy Lifts
- Personal Cargo Clearing and Handling
- Bulk Liquid Logistics
- Bunkering





**SEA MASTER SHIPPING (PVT) LTD**

No. 100 , 16th Lane ,College Street
Colomob 13

+94 112 440077 | info@seamaster.lk

www.seamaster.lk




මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/MAGAZINE/03/2026